

# වාර්ෂික වාර්තාව
# 2021

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

**தேசிய போக்குவரத்து ஆணைக்குழு**

National Transport Commission

# ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ජාගකොස)

**ලිපිනය**
241, උද්‍යාන පාර,
කොළඹ 05

**වෙබ් අඩවිය**
www.ntc.gov.lk

**විද්‍යුත් තැපෑල**
info@ntc.gov.lk

**ක්ෂණික ඇමතුම්**
1955

# සභාපතිතුමාගේ පණිවුඩය



2021 වර්ෂයේදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින්, අතිගරු ජනාධිපතිතුමාගේ රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ශ්‍රී ලාංකික ජනතාවට කාර්යක්ෂම, ඉහළ ප්‍රමිතියකින් යුත් පරිසර හිතකාමී, සුවපහසු ප්‍රවාහන සේවාවක් ලබාදීම සඳහා ව්‍යාපෘති රැසක් හා ප්‍රවාහනයට නූතන ප්‍රවේශයක් ඇති කරනු වස් කාර්යයන් රැසක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.
ඒ අතරින් සිසු සැරිය ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාම හා පාසල් දරුවන් අතර මෙම බස්රථ සේවාව ප්‍රචලිත කිරීම, පෞද්ගලික හා ලංගම බස් රථ සඳහා ඒකාබද්ධ කාල සටහන් සකස් කිරීම හා දුම්රිය සේවය සමඟ ඒකාබද්ධ බස් රථ සේවා ආරම්භ කිරීම, රියදුරු පුහුණු වැඩසටහන් නව මුහුණුවරකින් ක්‍රියාත්මක කිරීම, පොදු ප්‍රවාහන බස් රථ සඳහා පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමත් ඉන් ප්‍රධාන ස්ථානයක් ගනු ලැබිණ. මීට අමතරව ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා ගැමි සැරිය, නිසි සැරිය ව්‍යාපෘති අඛණ්ඩව පවත්වා ගෙන යාම, පොදු ප්‍රවාහනය භාවිතා කරන මගීන්ට සුව පහසු ගමනක් - පරිසර හිතකාමී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා නවීන තාක්ෂණය පොදු ප්‍රවාහනයට හඳුන්වා දීම සඳහා ව්‍යාපෘති රැසක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි.
නමුත් 2021 වර්ෂයේ අප්‍රේල් මස ආරම්භ වූ කොවිඩ් - 19 වසංගතයේ දෙවන රැල්ල හේතුකොට ගෙන පැනනැගුණු අභියෝග හමුවේ සැලසුම් කළ ව්‍යාපෘති බලාපොරොත්තු වූ ඉලක්කය කරා යාමට නොහැකි වුවද, ඉන් සමහරක් ව්‍යාපෘති සැලකිය යුතු මට්ටමකින් සාර්ථක කර ගැනීමට හැකියාව ලැබුණි.

එසේ අභියෝග රැසක් මධ්‍යයේ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කටයුතු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා සහාය වූ ගරු ප්‍රවාහන අමාත්‍යතුමාටත්, ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමාටත්, ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් ඒ සඳහා සහයවූ ප්‍රවාහන අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ටත් , ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ සමස්ථ කාර්යමණ්ඩලයටත් පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිවල සභාපතිතුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩල වලටත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු නිලධාරී මණ්ඩලයටත් සියළුම බස්රථ හිමියන්ටත් නන් අයුරින් සහයෝගය දක්වන ලද සියළු පාර්ශවයන්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

**ශශී වෙල්ගම**
**සභාපති,**
**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**

## පටුන


| | | | |
|---|---|---|---|
| | | **පරිච්ඡේදය** | **පිටුව** |
| **1.** | | **ජාතික ගමනාගමන කොමිෂන් සභාව** | 07 |
| | 1.01 | හැඳින්වීම | 07 |
| | 1.02 | අපගේ දැක්ම සහ මෙහෙවර | 09 |
| | 1.03 | කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය | 09 |
| | 1.04 | ජාතික කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය | 10 |
| | 1.05 | කොමිෂන් සභාවේ සංයුතිය | 11 |
| | 1.06 | අපගේ අරමුණු | 13 |
| **2.** | | **2021 වර්ෂයේ කාර්යසාධන** | 14 |
| | 2.01 | සමාජයීය ශුභසාධනය ප්‍රමුඛ කොටගත් බස් සේවා සැපයීම | 14 |
| | 2.02 | බස් නැවතුම්පල නඩත්තු කිරීම හා බස් පර්යන්ත මෙහෙයුම් | 20 |
| | 2.03 | බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම | 22 |
| | 2.04 | ප්‍රවාහන ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ | 24 |
| | 2.05 | දුර ගමන් සේවා සීමිත නැවතුම් සංඥා පුවරු සවි කිරීම | 26 |
| | 2.06 | ශ්‍රී ලංගම හා පෞද්ගලික බස්රථ සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම | 27 |
| | 2.07 | බස් ගාස්තු සකස් කිරීම හා විෂමතා ඉවත් කිරීම | 28 |
| | 2.08 | ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 30 |
| | 2.09 | පොදු ප්‍රවාහන බස්රථ ක්ෂේත්‍රය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම | 31 |
| | 2.10 | බස්රථ සඳහා ජී.පී.එස්. (GPS) සවිකිරීම | 34 |
| | 2.11 | ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව සකස් කිරීම | 35 |
| | 2.12 | Park & Ride ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කිරීම | 36 |
| | 2.13 | පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමය (Electronic Fare Collection) | 37 |
| | 2.14 | ජාගකොස බලශක්ති අවශ්‍යතාව සඳහා සූර්ය පැනල සවි කිරීම | 38 |
| **3.** | | **ව්‍යාපෘති නොවන කාර්යයන්** | 39 |
| | | **වාර්ෂික ගිණුම්** | **47** |
| | | **විගණකාධිපති වාර්තාව** | **65** |

# 1.0 ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## 1.01 හැඳින්වීම.



බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව, ආණ්ඩුවට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව ස්ථාපනය කර ඇත.

එම පනතේ 3 වන වගන්තිය අනුව නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද එනම් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන,ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුගේ නිලයට අඩු නොවන නිලයක වූ, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකුගෙන්; ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ විෂය භාර අමාත්‍ය වරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයෙකුගේ නිලයට අඩු නොවන නිලයක වූ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිළධරයෙකුගෙන්; මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, අධ්‍යක්ෂවරයෙකුගේ නිලයට අඩු නොවන නිලයක වූ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිළධරයෙකුගෙන් සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ගරු ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තවත් සාමාජිකයින් පස් දෙනෙකුගෙන්ද සමන්විත කොමිෂන් සභාව ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවකි.

උක්ත පනතින් පැවරී ඇති කර්තව්‍යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම්, ධාවන හා සේවා අධීක්ෂණ, තත්ත්ව ආරක්ෂණ සහ බාහිර සම්බන්ධතා, මුදල් හා ප්‍රසම්පාදන යන

දෙපාර්තමේන්තු හතරක් සහ පාලන, අභ්‍යන්තර විගණක හා නීති යන අංශ 3ක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අතර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය 241,උද්‍යාන පාර, කොළඹ 05 යන ලිපිනයේ පිහිටා ඇත. කොළඹ බැස්ටියන් මාවත අන්තර්පළාත් පෞද්ගලික බස්නැවතුම්පළ සහ වවුනියාව ප්‍රධාන බස් නැවතුම්පළ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ ශාඛා කාර්යාල වශයෙන් ක්‍රියාත්මක වේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 219 වන අතර සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන දෙපාර්තමේන්තු 04 යටතේ කටයුතු කරන අධ්‍යක්ෂ වරුන් හතර දෙනෙකුගෙන් කොමිෂන් සභාවේ ජ්‍යේෂ්ඨ කළමණාකරණය සමන්විතවේ.

**1.02** අපගේ දැක්ම සහ මෙහෙවර

## අපගේ දැක්ම...

*දිවයින තුළ සමාජ-ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීම සඳහා ගුණාත්මක, පිරිවැය ඵලදායී සහ ආරක්ෂාකාරී ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් හා සේවාවක් මගින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගේම විවිධ ගමනාගමන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සහතිකවීම.*

## අපගේ මෙහෙවර...

*මගී ප්‍රවාහනයට අදාල ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් දීම සහ පොදුජන ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම බස් ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා අවශ්‍ය නියාමන රාමුවක් සකස්කිරීම.*

**1.03** කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය

**2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා**

| | | |
|---|---|---|
| 1. | ශශී වෙල්ගම මහතා<br>සභාපති<br>ජාතික ගමනාගමන කොමිෂන් සභාව | -සභාපති |
| 2. | ඩී.සී.ඩබ්. හපුගොඩ මහත්මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>මුදල් අමාත්‍යාංශය | -සාමාජික (නිලබලයෙන්) |
| 3. | එස්. ජලදීපන් මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන)<br>මුදල් අමාත්‍යාංශය | -සාමාජික (නිලබලයෙන්) |
| 4. | ජේ.ඒ.එම්.ආර්. ජයසිංහ මහතා<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන)<br>ප්‍රවාහන අමාත්‍යාංශය | -සාමාජික (නිලබලයෙන්) |
| 5. | එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මුදලිගේ මහතා<br>කළමණාකාර අධ්‍යක්ෂ<br>සඳමාලි ටුවර්ස් පුද්ගලික සමාගම | -සාමාජික |
| 6. | එස්.ආර්. ගොඩමුණේ මහතා<br>අධ්‍යක්ෂ<br>නිශානීස් පුද්ගලික සමාගම | -සාමාජික |
| 7. | කේ. බුද්ධදාස මහතා<br>හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂ<br>ජාතික ගමනාගමන කොමිෂන් සභාව | -සාමාජික |
| 8. | බී.ඒ.ඩී.ඒ. සම්පත් රණසිංහ මහතා<br>සභාපති<br>පොදුජන පුද්ගලික බස් සංගමය | -සාමාජික |

## 1.04 ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ජ්‍යේෂ්ඨ කළමණාකාරීත්වය

| | | |
|---|---|---|
| 1. | ශශී වෙල්ගම මහතා | - සභාපති |
| 2. | ආචාර්ය නිලාන් මිරැන්ඩා මහතා | - අධ්‍යක්ෂ ජනරාල් |
| 3. | කේ.ඒ.සී. කරුණාරත්න මහත්මිය | - අධ්‍යක්ෂ (සැලසුම්) |
| 4. | බී.එම්.ඉෆ්තිකාර් මහතා | - අධ්‍යක්ෂ (ධාවන හා සේවා අධීක්ෂණ) |
| 5. | එස්.ඩී. අතුකෝරල මහත්මිය | - අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා) |
| 6. | ඩී.එම්.කේ. දිසානායක මහතා | - අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන) |
| 7. | පී.ජී.සී. කරුණාරත්න මහතා | - සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) |
| 8. | පී.ආර්.ඒ.ටී.එන්. රණතුංග මහතා | - සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) |
| 9. | එච්.බී.සී. කුමාර මහතා | - සහකාර අධ්‍යක්ෂ ( ධාවන හා සේවා අධීක්ෂණ ) |
| 10. | ආර්.ඒ. ඉන්දික ලාල් මහතා | - සහකාර අධ්‍යක්ෂ ( ධාවන හා සේවා අධීක්ෂණ ) |
| 11. | මුදිත නවරත්න මහතා | - සහකාර අධ්‍යක්ෂ ( තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා ) |
| 12. | එල්.එස්. විජේන්ද්‍ර මහත්මිය | - සහකාර අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා ) |
| 13. | පී.ඒ.එන්. ප්‍රනාන්දු මහත්මිය | - සහකාර අධ්‍යක්ෂ ( ප්‍රසම්පාදන ) |
| 14. | ඩී.එන්. වීරතුංග මහත්මිය | - සහකාර අධ්‍යක්ෂ ( මුදල් ) |
| 15. | ඒ.ඒ.එච්.එන්. මුණසිංහ මහත්මිය | - සහකාර අධ්‍යක්ෂ ( නීති ) |
| 16. | එස්.එන්. පෙරේරා මහත්මිය | - සහකාර අධ්‍යක්ෂ ( ප්‍රවාහන ඉංජිනේරු) |

## 1.05 කොමිෂන් සභාවේ සංයුතිය


2021 වර්ෂය අවසාන වනවිට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 219 ක් වු අතර සේවයේ යෙදී සිටි ස්ථිර සේවක සංඛ්‍යාව 180 ක් විය.

2021.12.31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව

| අනු අංකය | තනතුරු නාමය | සේවක කාණ්ඩය | අනුමත කාර්යමණ්ඩලය | 2021.12.31 දිනට සේවයේ යෙදි සිටි කාර්යමණ්ඩලය |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | HM 2 -1 | 01 | 01 |
| 02 | අධ්‍යක්ෂ | HM 1-1 | 04 | 04 |
| 03 | සහකාර අධ්‍යක්ෂ | MM 1-1 | 17 | 12 |
| 04 | කණිෂ්ඨ කළමනාකාර | JM 1-1 | 21 | 20 |
| 05 | කළමනාකරණ සහකාර | MA 4 | 36 | 35 |
| 06 | කළමනාකරණ සහකාර | MA 2-1 | 03 | 0 |
| 07 | කළමනාකරණ සහකාර | MA 1-1 | 76 | 66 |
| 08 | රියැදුරු | PL 3 | 13 | 13 |
| 09 | කාර්යාල කාර්ය සහායක | PL 1 | 12 | 10 |
| 10 | වේලා සටහන්කරු | PL 1 | 33 | 18 |
| 11 | කම්කරු | PL 1 | 03 | 01 |
| | එකතුව | | 219 | 180 |

මුලාශ්‍රය - පාලන දෙපාර්තමේන්තුව, ජාගකොස

## NTC Organization Structure



## 1.06 අපගේ අරමුණු

- *විශ්වසනීය හා මිත්‍රශීලී පොදු මගී ප්‍රවාහන සේවාවක් දිවයින තුළ ස්ථාපිත කිරීම.*
- *අවම ප්‍රවාහන පහසුකම් සහිත හෝ ප්‍රවාහන පහසුකම් නොමැති ප්‍රදේශවල ජනතාවට පොදු මගී ප්‍රවාහන සේවා සැපයීම.*
- *නවීන තාක්ෂණය පදනම් කරගනිමින් සුහුරු ප්‍රවාහන සේවාවක් හඳුන්වා දීම.*
- *මගී ප්‍රවාහනයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.*
- *විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා අවශ්‍ය පහසුකම් පොදු මගී ප්‍රවාහන සේවාව තුළ ස්ථාපිත කිරීම.*
- *විශ්වසනීය හා මිත්‍රශීලී මගී ප්‍රවාහන සේවා මෙන්ම භාණ්ඩ ප්‍රවාහන සේවා පහසුකම් ද පොදු මගී ප්‍රවාහන මාධ්‍ය තුළ සැපයීම.*
- *මගී ප්‍රවාහන සේවාව හා සම්බන්ධ මානව සම්පත් සංවර්ධනය.*
- *සෑම පුදගලයෙකුටම දැරිය හැකි ගාස්තු ක්‍රමයක් පොදු මගී ප්‍රවාහන සේවා සඳහා හඳුන්වා දීම.*
- *වාහන මඟින් සිදු වන පරිසර දූෂණය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.*
- *මාර්ග අනතුරු අවම කිරීම.*
- *සමාජ සුභසාධනය සඳහා අවශ්‍ය වන මගී ප්‍රවාහන සේවා සැපයීම.*

## 2. 2021 වර්ෂයේ කාර්යසාධනය

බස් රථ මගින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව, රජයට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව පිහිටුවා ඇත.

1991 අංක 37 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනත පිළිවෙලින් 1996 අංක 30 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මගින්ද 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල පනත මගින්ද 2017 අංක 6 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මගින්ද සංශෝධනය වී ඇත.

පනතින් දක්වා ඇති ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍යයන්ට අනුකූලව, විවිධ කාර්යයන් සම්බන්ධයෙන් ලබාගෙන ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතීන්ට සහ අතිගරු ජනාධිපතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව ශ්‍රී ලාංකික ජනතාවට කාර්යක්ෂම, ඉහළ ප්‍රමිතියකින් යුත් පරිසර හිතකාමී, සුවපහසු ප්‍රවාහන සේවාවක් සැපයීම සහ ප්‍රවාහනයට නූතන ප්‍රවේශයක් ඇති කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව ව්‍යාපෘති රැසක් 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදී.

එම ව්‍යාපෘති වල 2021 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා ප්‍රගතිය පහත දක්වා ඇත.

### 2.01 සාමාජයීය සුභසාධනය ප්‍රමුඛ කොටගත් බස්රථ සේවා සැපයීමේ ව්‍යාපෘතිය
**'සිසු සැරිය' පාසල් බස්රථ සේවාව**





පාසල් දරුවන්ට මානසික හෝ ශාරීරික අපහසුතාවයකින් තොරව කලට වේලාවට පාසල් වෙත පැමිණීමටත් අධ්‍යාපන කටයුතු නිමාකොට ආරක්ෂිතව නිවස කරා යාමටත් සහන ගාස්තු ක්‍රමයක් යටතේ වඩාත් විශ්වාසනීය වූ, ආරක්ෂා සහිත පාසල් දරුවන්ටම වෙන්වූ පාසල් බස්රථ සේවාවක්

සැපයීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. පාසැල් දරුවන් පොදු ප්‍රවාහන බස්රථ භාවිතයට යොමු කොට පාසැල් ආරම්භ වන වේලාවන්හිදී හා පාසැල් අවසන් වන වේලාවන්හිදී නගර කරා ළගාවන ආසන ධාරිතාවයෙන් අඩු පෞද්ගලික වාහන සංඛ්‍යාව අවම කර නාගරික වාහන තදබදය සහ එමගින් සිදුවන ඉන්ධන හානිය, පරිසර දූෂණය වැලැක්වීමත් පෞද්ගලික පාසල් ප්‍රවාහන මාධ්‍ය (වෑන් රථ හා බස්රථ) සඳහා දෙමාපියන්ට ගෙවීමට සිදුවන අධික ගාස්තු සඳහා යම් සහනයක් සැලසීමත් මෙම ව්‍යාපෘතියේ සෙසු අරමුණු අතර වැදගත් අරමුණු වේ.


මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංගම සහ පෞද්ගලික බස්රථ ධාවනය කරන අතර මෙම බස්රථ වලින් ගමන්ගන්නා පාසල් දරුවන්ගෙන් සාමාන්‍ය බස්ගාස්තුවෙන් අඩක් පමණක් අයකිරීම සහ ශ්‍රී ලංගම බස්රථවල වාර ප්‍රවේශ පත්‍ර වලින් ගමන් පහසුකම් සකසා ගත හැකිවීම විශේෂත්වයකි. එමගින් ධාවකයාට වන මූල්‍යමය හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා පාසල් දරුවන් රැගෙන ධාවනය වන කි.මී. 01කට රු. 57/-බැගින් උපරිම කි.මී. 110 (උදේ හවස ගමන්වාර දෙක සඳහා) සහනාධාරයක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබේ.

**සිසු සැරිය ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය**

2021 වර්ෂය සඳහා නව සේවා 80 ක් ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. නමුත් 2021 වර්ෂයේ සිසු සැරිය සේවා සඳහා අධික ඉල්ලුමක් ඇතිවූ අතර ඒ අනුව 2021.12.31 දින වන විට මුළු දිවයිනම ආවරණය වන පරිදි නව සිසු සැරිය සේවා 97ක් ආරම්භ කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 121.25 ක් විය. ඒ අනුව පසුගිය වසර 05 තුළ මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| පළාත | සිසු සැරිය බස් සේවා සංඛ්‍යාව (සමුච්චිත සංඛ්‍යාව) දෙසැම්බර් 31 දිනට | | | | |
|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **2019** | **2020** | **2021** |
| බස්නාහිර | 424 | 431 | 422 | 426 | 431 |
| දකුණ | 272 | 286 | 104 | 107 | 107 |
| වයඹ | 147 | 155 | 298 | 321 | 351 |
| උතුරු මැද | 121 | 118 | 163 | 168 | 187 |
| සබරගමුව | 126 | 127 | 122 | 122 | 123 |
| ඌව | 82 | 92 | 100 | 111 | 141 |
| නැගෙනහිර | 109 | 115 | 117 | 117 | 122 |
| මධ්‍යම | 48 | 51 | 51 | 53 | 55 |
| උතුර | 32 | 36 | 36 | 36 | 36 |
| අන්තර් පළාත් | 09 | 07 | 07 | 07 | 12 |
| **එකතුව** | **1370** | **1418** | **1420** | **1468** | **1565** |

මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස




මීට අමතරව කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතු කොටගෙන දරුවන් සෞඛ්‍යාරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා උපදෙස් ලබාදීම, සෞඛ්‍යාරක්ෂිතව බස්රථ වල ආසන සංඛ්‍යාවට පමණක් දරුවන් රැගෙන යාම සඳහා මෙම බස්රථ වලින් අතිරේක ගමන් වාර සැපයීමද සිදු කරන ලදී. විශේෂයෙන්ම 2021 වර්ෂයේ මාර්තු මස අ.පො.ස.(සා.පෙළ) විභාගය පැවති කාලසීමාව තුළ පාසැල් දරුවන්ගේ ප්‍රවාහනය කටයුතු අඛණ්ඩව, සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාමද මෙම ව්‍යාපෘතිය යටතේ ධාවනය වන ශ්‍රී ලංගම සහ පෞද්ගලික බස්රථ මගින් සිදුකරන ලදී.

2021 වර්ෂයේ නොවැම්බර් මස යළි පාසල් විවෘත කිරීමත් සමග "සිසු සැරිය "පාසල් බස්රථ සේවය සඳහා විශාල ඉල්ලුමක් දෙමාපියන්ගෙන් සහ පාසල් වලින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලැබුන අතර මෙම ඉල්ලීම් සඳහා බස්රථ සැපයීම ප්‍රමාද වීම වැලැක්වීම (කඩිනම් කිරීම ) සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ,

- ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පළාත් බඳ මාර්ග සඳහා සිසු සැරිය සේවා සැපයීම සඳහා සිසු සැරිය සේවා සඳහා පමණක් වන මගීසේවා අවසර පත්‍ර නිකුත් කිරීම.
- අන්තර් පළාත් සිසු සැරිය සේවා සඳහා සිසු සැරිය පමණක් මගීසේවා අවසර පත්‍ර නිකුත් කිරීම.
- වසර 15 ට වඩා පැරණි බස්රථ මෝටර් රථ දෙපාර්තමේන්තුවේ විශේෂ පරීක්ෂාවකට යොමු කර තත්ත්ව වාර්තා ලබාගෙන සිසු සැරිය සේවාව සඳහා යෙදවීමට අවසර දීම.
- ඉන්ධන මිල වැඩිකිරීමට සාපේක්ෂව සිසු සැරිය සේවාව යටතේ ධාවනය කරනු ලබන බස්රථ සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල වැඩිකිරීමට අනුමැතිය ඉල්ලා අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යෝජනාවක් ඉදිරිපත් කිරීම.

  සිදු කරන ලදී.

**'ගැමි සැරිය' ග්‍රාමීය බස්රථ සේවා ව්‍යාපෘතිය**

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 8 වන වගන්තිය(ඒ) ඡේදය අනුව බස් සේවා සැපයීම සඳහා තරඟකාරී ඉල්ලුම් සලකා බැලීමෙන් පසුව තැනැත්තන් සමග ගිවිසුම්වලට ඇතුළත් වීමෙන් ලාභ නොලබන මාර්ග වල බස්රථ සේවා සැලසෙන බවට වගබලා ගැනීම සහ අවශ්‍ය විටෙක එවැනි සේවා සලසන තැනැත්තන්ට මූල්‍යාධාර සැපයීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කාර්යයකි. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2005 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.






ඒ අනුව කිසිදු බස්රථ සේවාවක් ක්‍රියාත්මක නොවන, සමාජයීය වශයෙන් බස්රථ සේවාවක් අවශ්‍ය වුවද ලාභ නොලබන මාර්ග බැවින් මගී ප්‍රවාහනය සඳහා ධාවකයින් ඉදිරිපත් නොවන ග්‍රාමීය ප්‍රදේශ වල වෙසෙන ජනතාවට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා සහනාධාර යටතේ පොදු ප්‍රවාහන බස්රථ සේවා ආරම්භ කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

'ගැමිසැරිය' බස්රථ සේවාව සඳහා ධාවකයින් තෝරාගැනීම විවෘත ටෙන්ඩර් පරිපාටියක් යටතේ සිදුකරන අතර එහිදී කි.මී. එකකට රු.38/- උපරිම සහනාධාරයක් ගෙවීමේ පදනම මත කි.මී. 01 සඳහා අඩුම ලංසුවක් ඉදිරිපත් කරන ධාවකයා තෝරාගනී. එසේ තෝරාගන්නා ධාවකයාට අදාළ ප්‍රවාහන අධිකාරිය මගින් ග්‍රාමීය මාර්ගයන්හි මගී ප්‍රවාහනයට මගීසේවා අවසරපත්‍රයක් නිකුත් කරන අතර, එම මගීසේවා අවසර පත්‍රය සහ පළාත් ප්‍රවාහන අධිකාරියේ නිර්දේශය මත ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අදාළ බස්රථ හිමියා ගැමිසැරිය ව්‍යාපෘතියට ඇතුලත් කර ගිවිසුම් අත්සන් කරනු ලැබේ.

මෙම ගිවිසුම අනුව එකඟවන සහනාධාර මුදල උපරිම වසර තුනක් සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබේ. වසර තුනකින් පසු එම මාර්ගය ආර්ථික වශයෙන් ඵලදායී මාර්ගයක් විය හැකි බැවින් සහනාධාර ගෙවීම් අත්හිටුවනු ලැබේ. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද ගැමිසැරිය සේවා රැසක් මේ වන විට ආර්ථික වශයෙන් ඵලදායී ලෙස ග්‍රාමීය ජනතාවට සේවා සපයමින් ක්‍රියාත්මක වේ.

**ගැමිසැරිය ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේ නව සේවා 20 ක් ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. අතිගරු ජනාධිපතිතුමා සහභාගී වන ගම සමග පිළිසඳර වැඩසටහන් වලදී ගමට බස්රථයක් ලබාදෙන ලෙස කර ඇති ඉල්ලීම් 24 ක් 2021.12.31 දින වන විට ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර එයින් 11 ක් සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ යෙදවීමට කටයුතු කරන ලද අතර

ඉතිරි මාර්ග 13 සඳහා ටෙන්ඩර් කර මගීසේවා අවසර පත්‍ර නිකුත් කිරීමට අදාළ තොරතුරු රැස්කිරීම (මාර්ගයේ තත්ත්වය, මාර්ගයේ දුර, දැනට පවතින ප්‍රවාහන සේවා වැනි ) සඳහා අදාළ පළාත් ප්‍රවාහන අධිකාරී වලට යොමු කිරීම 2021.12.31 දින වන විට සිදු කර ඇත.

2017 වර්ෂයේ සිට 2021.12.31 දින වන විට සහනාධාර ලබමින් ක්‍රියාත්මක වූ 'ගැමි සැරිය' සේවා සංඛ්‍යාව පහත වගුවෙහි දැක්වේ.

| පළාත | 'ගැමි සැරිය' බස් සේවා සංඛ්‍යාව (සමුච්චිත සංඛ්‍යාව) | | | | |
|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **2019** | **2020** | **2021** |
| බස්නාහිර | | | | | |
| දකුණ | | | | | |
| වයඹ | 02 | 04 | 04 | 04 | 03 |
| උතුරු මැද | | | | | |
| සබරගමුව | | | | | |
| ඌව | | | | | |
| නැගෙනහිර | 02 | 02 | 10 | 11 | 10 |
| මධ්‍යම | 02 | 02 | 01 | 01 | |
| උතුර | | | | | |
| අන්තර් පළාත් | | | | | |
| **එකතුව** | **06** | **08** | **15** | **16** | **13** |

මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස

**'නිසිසැරිය' රාත්‍රී බස් සේවා ව්‍යාපෘතිය**

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2005 වර්ෂයේදී මෙම නිසිසැරිය රාත්‍රී බස්සේවා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.



රාත්‍රී කාලයේ හා අළුයම කාලයේ පොදු ප්‍රවාහන බස්රථ සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම දිරිමත් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මෙම ව්‍යාපෘතිය හඳුන්වා දී ඇති අතර මෙමගින් රාත්‍රී කාලයේ හා අළුයම පොදු ප්‍රවාහන බස්රථ අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම නිසා මහජනතාව පත්වන දුෂ්කරතා අවම කර ඔවුන්ට ස්ථිර පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් සැපයීමත්, මහජනයාට රාත්‍රී හා අළුයම කාලයේ වෙනත් ප්‍රවාහන මාධ්‍ය (ත්‍රී රෝද රථ, කුලී රථ) සපයා ගැනීම සඳහා වැය කිරීමට සිදුවන අධික පිරිවැය සහ වැයවන කාලය අවම කිරීමත් මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ රාත්‍රී අවසන් ගමන් වාරයට සහ අළුයම පළමු ගමන්වාරයට සහනාධාර වශයෙන් කි.මී. 01 කට රු. 19 /-ක් රජය විසින් ගෙවීම් කරන අතර මහජනතාවගෙන් අයකරනු ලබන්නේ නියමිත බස්ගාස්තුව පමණි.


**නිසි සැරිය ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ ධාවනය වන සියළුම බස්රථ ශ්‍රී ලංගම බස්රථ වන අතර 2021 වර්ෂයේ නව සේවා 50 ක් ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව 2021.12.31 දින වන විට නව සේවා 33 ක් සඳහා ශ්‍රී ලංගම ඩිපෝ සමග ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 66 ක් වේ.

2017 වර්ෂයේ සිට 2021 12.31 දක්වා ක්‍රියාත්මක 'නිසි සැරිය' බස් සේවා පිළිබඳ විස්තර පහත වගුවෙහි දැක්වේ.

| පළාත | නිසි සැරිය බස් සේවා සංඛ්‍යාව (සමුච්චිත සංඛ්‍යාව) | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| බස්නාහිර | 54 | 62 | 62 | 62 | 62 |
| දකුණ | 16 | 33 | 33 | 33 | 40 |
| වයඹ | 14 | 05 | 20 | 21 | 21 |
| උතුරු මැද | 11 | 11 | 11 | 11 | 11 |
| සබරගමුව | 03 | 03 | 08 | 08 | 08 |
| ඌව | 09 | 09 | 09 | 12 | 12 |
| නැගෙනහිර | 03 | 03 | 03 | 03 | 03 |
| මධ්‍යම | 20 | 27 | 28 | 37 | 63 |
| උතුර | - | - | 05 | 05 | 5 |
| **එකතුව** | 130 | **173** | 179 | 192 | 225 |

මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස




**මූල්‍ය ප්‍රගතිය “සිසු සැරිය” “ගැමි සැරිය” සහ “නිසි සැරිය ” ව්‍යාපෘති**

2021 ආරම්භ වන විට ආරම්භ කර තිබූ සිසු සැරිය සේවා 1,468 ගැමි සැරිය සේවා 16 ක්, නිසිසැරිය සේවා 192 ක් සඳහා සහනාධාර ගෙවීමට සහ 2021 ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ නව සිසු සැරිය සේවා 80, ගැමිසැරිය නව සේවා 20 සහ නිසිසැරිය නව සේවා 50 සඳහා සහනාධාර ගෙවීම් කිරීමට 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘති සඳහා ජාතික අයවැයෙන් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 650 කි.

නමුත් කොවිඩ් -19 වෛරස් වසංගත තත්ත්වය හේතු කොටගෙන දීර්ඝ කාලයක් පාසැල් වසා තිබීම, සංචරණ සීමා පැනවීම් නිසා සාමාන්‍ය පරිදි ගමනාගමන කටයුතු සිදු නොවීම හේතු කොට ගෙන මෙම බස්රථ ඉලක්ක කළ දින ගණන ධාවනය නොවීය. ඒ අනුව මෙම ව්‍යාපෘති සඳහා සහනාධාර ගෙවීමට රුපියල් මිලියන 271.0ක් මහා භාණ්ඩාගාරයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලබාදෙන ලදී.

## 2.02 බස්නැවතුම් පළ නඩත්තු කිරීම හා බස් පර්යන්ත මෙහෙයුම් ව්‍යාපෘතිය





2021 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට සැලසුම් කරන ලද කාර්යයන්

- ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පරිපාලනය යටතේ පවතින කොළඹ බැස්ටියන් මාවත පෞද්ගලික දුරසේවා බස්රථ නැවතුම්පළ, වව්නියාව බස් නැවතුම්පළවල ධාවන කටයුතු මෙහෙයවීම සහ එම ස්ථාන නඩත්තු කටයුතු සිදු කිරීම.
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කළමනාකරණය කරනු ලබන මාකුඹුර, කඩුවෙල, කඩවත බස්නැවතුම්පළ වලින් ක්‍රියාත්මක අධිවේගී මාර්ග හරහා සිදුකරනු ලබන බස්රථ ධාවන කටයුතු මෙහෙයවීම.
- බස්රථ වල ප්‍රමිති පරීක්ෂාව සඳහා ඒ සඳහා ජංගම වැඩසටහන් 15ක් පැවැත්වීම.
- බස්රථවල පිළිවිතර සම්බන්ධයෙන් ප්‍රවාහන අධිකාරීවල නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පැවැත්වීම.
- 2021 සිංහල අළුත් අවුරුදු කාලයේ  බස්රථ සේවාව සහ අනෙකුත් විශේෂිත උත්සව සඳහා මගීන්ට අවශ්‍ය පරිදි බස්රථ සේවා මෙහෙයවීම.

**භෞතික ප්‍රගතිය**

ඒ අනුව 2021 වර්ෂයේ සිංහල අළුත් අවුරුදු බස්රථ සේවාව සාර්ථකව මෙහෙයවීම සිදු කළ අතර සිංහල අළුත් අවුරුදු කාල සීමාව තුළ (2021.04.09 -2021.04.12) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කළමනාකරණය යටතේ පවතින කොළඹ බැස්ටියන් මාවත බස් පර්යන්තයෙන් සහ අධිවේගී මාර්ග බස් සේවා ක්‍රියාත්මක බස් නැවතුම්පළ වලින් පිටත් කරවන ලද බස්රථ ගමන්වාර සංඛ්‍යාව 4,264කි.

| බස් පර්යන්තය | බස්රථ ගමන්වාර සංඛ්‍යාව |
|---|---|
| බැස්ටියන් මාවත | 3,745 |
| මාකුඹුර | 242 |
| කඩවත | 162 |
| කඩුවෙල | 115 |
| **එකතුව** | **4,264** |

මූලාශ්‍රය - ධාවන දෙපාර්තමේන්තුව, ජාගකොස

බස්රථ වල ප්‍රමිති පරීක්ෂා කිරීමේ වැඩසටහන් 03ක් සිදුකරන ලද අතර එහිදී බස්රථ 800ක ප්‍රමිති පරීක්ෂා කරන ලදි. එම වැඩසටහන් වලදී  නියමිත ප්‍රමිතියට නොමැති බස්රථ 67 ක් හඳුනාගන්නා ලද අතර එම බස්රථ නියමිත ප්‍රමිතියට සකස් කරවා ධාවනයට යොදවා ඇත. ඒ අනුව 2021.12.31 දින බස්රථ වල ප්‍රමිති පරීක්ෂාව සඳහා පවත්වන ලද ජංගම වැඩසටහන් වල භෞතික ප්‍රගතිය සියයට 20ක් වන අතර පරීක්ෂා කරන ලද බස්රථ සංඛ්‍යාව අනුව ප්‍රගතිය  සියයට 26ක් පමණ විය.

කොවිඩ්-19 වෛරස් වසංගතය හමුවේ මෙම බස් පර්යන්ත සහ බස්රථ මෙහෙයුම් කටයුතු සෞඛ්‍ය නිර්දේශ වලට අනුකූලව පවත්වාගෙන යාම 2021 ජනවාරි සිට 2021.12.31 දින දක්වා අන්තර් පළාත් බස්රථ ධාවනය වූ සෑම දිනකම අඛණ්ඩව සිදු කරන ලදී.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (ජාගකොස අරමුදල් වලින් පුනරාවර්තන වියදම් යටතේ) රුපියල් මිලියන 4.5 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 2.643ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021.12.31 දිනට මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 59 ක් වේ.

## 2.03 බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම

ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් මගී ජනතාවට ලබාදීමේ අරමුණින් අන්තර් පළාත් පුද්ගලික බස්රථවල සේවය කරන සේවක මණ්ඩල සඳහා විවිධ ක්ෂේත්‍ර යටතේ වෘත්තීමය පුහුණුවීම් ලබාදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

අතිගරු ජනාධිපති තුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව

- මාර්ග තදබදය සහ අනතුරු ප්‍රධාන හේතුවක්වී තිබෙන රියදුරන්ගේ වගකීමෙන් තොර රිය ධාවනය වෙනුවට විනයගරුක රථ ධාවනය
- මගී මිත්‍රශීලී පොදු ප්‍රවාහන සේවාවන් සැපයීම
- මෙම අංශයේ සේවය කරන්නන්ගේ වෘත්තීයට ගෞරවයක් ලබාදීම
- ඔවුන්ගේ ආකල්ප හැසිරීමේ වෙනසක් ඇති කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදීම

සඳහා අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදීම කෙරෙහි මෙම වසරේ විශේෂ අවධානයක් යොමු කළ අතර මෙම පුහුණු වැඩමුළු නව ප්‍රවේශයකින් පහත අංශ කෙරෙහි වැඩි අවධනයක් යොමු කරමින් ක්‍රියාත්මක කිරීමට 2021 වර්ෂයේ දී කටයුතු කරන ලදි .

ඒ අනුව ශ්‍රී ලංකා පොලීසිය, කාන්තා හා ළමා කටයුතු කාර්යාංශය, ජාතික අන්තරායකර ඖෂධ නියාමන අධිකාරිය වැනි ආයතනවල ප්‍රවීන දේශකවරුගේ සහභාගිත්වයෙන් පහත මාතෘකා ඔස්සේ දේශන පැවැත්වීම සිදු කරන ලදී.

- මාර්ග නීති පිළිපැදීම
- ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මගී සේවා අවසරපත්‍ර වෙනුවෙන් පනවා ඇති කොන්දේසි හා නියමයන්
- පාරිභෝගික සත්කාර සේවා සැපයීමේ ක්‍රමෝපායන්
- අන්තරායකර ඖෂධ භාවිතයේ ප්‍රතිවිපාක
- බස්රථ තුළ කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම

අන්තර් පළාත් බස්රථවල සේවය කරන රියදුරන් පුහුණු කිරීම, ආයතනය තුළදී මෙන්ම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු අභ්‍යාස විද්‍යාලයේදීද සිදුකරන ලද අතර එහිදී ඔවුන්ට ප්‍රායෝගික පුහුණුවීම් ලබාදීම මූලිකව සිදුකරන ලදී. ඒ අනුව පහත සඳහන් කාණ්ඩ කිහිපයක් ඔස්සේ මෙම පුහුණුවීම් සිදුකරන ලදී..

- ආධුනික රියදුරු, කොන්දොස්තරවරුන් සඳහා පුහුණුවීම්
- සේවයේ යෙදී සිටින සේවක මණ්ඩල සඳහා අවුරුදු තුනකට වරක් ලබාදෙන පුහුණුව
- විනය විරෝධී ක්‍රියාවල නිරතවූ රියදුරු කොන්දොස්තර මහතුන් සඳහා පවත්වන විශේෂිත පුහුණු





**භෞතික ප්‍රගතිය**


කොවිඩ් -19 වසංගත තත්ත්වය යටතේ පනවා ඇති සෞඛ්‍ය නිර්දේශ අනුව එක් පුහුණු සැසියකට උපරිම 60 දෙනෙකුගේ සහභාගීත්වයෙන් එවැනි වැඩමුළු 14 ක් පවත්වා පුද්ගලයින් 700 ක් සඳහා පුහුණුවීම් ලබාදීමට 2021 වර්ෂයේ සැලසුම් කරන ලදී.

නමුත් පුද්ගලයින් ඒකරාශී කර පුහුණු වැඩසටහන් පැවැත්වීම සෞඛ්‍ය නිර්දේශ අනුව සිදුකළ නොහැකි වීම නිසා 2021.12.31 දින විට පුහුණු වැඩසටහන් 07ක් පමණක් පවත්වා රියදුරු කොන්දොස්තරවරුන් 292 ක් පුහුණුකර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ලියාපදිංචි කරගන්නා ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ පුහුණු කර ලද රියදුරු කොන්දොස්තර වරුන් අනුව භෞතික ප්‍රගතිය සියයට 42 ක් වූ අතර පවත්වන ලද පුහුණු වැඩමුළු සංඛ්‍යාව අනුව සියයට 50 ක් විය.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (පුනරාවර්තන වියදම්) යටතේ රුපියල් මිලියන 2.5 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 1.316 ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 53 ක් වේ.

## 2.04 ප්‍රවාහන ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ




මහජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස, පිළිගත හැකි තත්ත්වයකින් යුත් බස්රථ සේවා පවතින්නේද යන වග අවලෝකනය කිරීම සහ එම සේවා පවත්වාගෙන යායුතු අවම මට්ටම තීරණය කිරීම; 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් දක්වා ඇති ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කර්තව්‍යයකි.


ඒ අනුව මහජනතාවගේ අවශ්‍යතාවය පරිදි විශ්වසනීය, ගුණාත්මක, සුවපහසු පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් ගෙවිය හැකි මිලකට සැපයීම සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම සහ එම දත්ත විශ්ලේශනය කර තීරණ ගැනීම සඳහා අදාළ පාර්ශවයන් වෙත යොමු කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.


ඒ අනුව පහත ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සමීක්ෂණ සිදු කරනු ලබයි.

- මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා හඳුනාගැනීම සහ ඒ අනුව නව බස්රථ සේවා ආරම්භ කිරීම සඳහා ගෙන් ගෙට ගොස් සිදුකෙරෙන සමීක්ෂණ (House Hold Survey )
- පවතින බස්රථ සේවාවල ධාවන කාලසටහන් සකස්කිරීම හා සංශෝධනය කිරීම සඳහා සිදුකෙරෙන මගී ඉල්ලුම් සමීක්ෂණ (Passenger Demand Survey)
- පවතින බස්රථ සේවාවේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් මහජනතාවගේ තෘප්තිමත්භාවය තහවුරු කරගැනීම සහ ඒ අනුව මහජනතාවට බලාපොරොත්තුවන ගුණාත්මක බස්රථ සේවා සැපයීම සඳහා සිදුකෙරෙන මගීන්ගේ අදහස් විමසීමේ සමීක්ෂණ (Passenger Interview Survey)
- බස්රථවල ධාවන කාල නිර්ණය කිරීම සඳහා සිදුකෙරෙන ධාවන කාල සමීක්ෂණ (Travel Time Survey )

**භෞතික ප්‍රගතිය**

2021 වර්ෂයේ සමීක්ෂණ 8 ක් සිදුකිරීමට සැලසුම් කරන ලදී. නමුත් කොවිඩ්-19 වසංගතය හමුවේ සංචරණ සීමා පැනවීම හේතුවෙන් සමීක්ෂණ මගින් රැස්කරගන්නා දත්ත වලින් සත්‍ය තත්ත්වය විද්‍යාමාන නොවන බැවින් සැලසුම් කළ සමීක්ෂණ වලින් සමීක්ෂණ 04 ක් පමණක් සිදුකරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 50 ක් විය.




සංචරණ සීමා මධ්‍යයේ රජයේ හා පෞද්ගලික අංශයේ ආයතන විවෘත කිරීමත් සමඟ පවතින වසංගත තත්ත්වය හමුවේ මහජනතාව පොදු ප්‍රවාහන බස්රථ භාවිතා කිරීම කෙසේ වෙනස් වී ඇද්දැයි හඳුනාගැනීම සහ සෞඛ්‍යාරක්ෂිතව මගීන් ප්‍රවාහනය කිරීම සඳහා ගතයුතු තීරණ සඳහා අවශ්‍යවූ දත්ත රැස්කිරීම සඳහා රජයේ සහ පෞද්ගලික කාර්යාල වල සේවය කරන නිළධාරීන් මූලික කර ගනිමින් අදහස් විමසීමේ සමීක්ෂණයක් මුළු දිවයිනම ආවරණය වන පරිදි 2021 වර්ෂයේ ඔක්තෝබර් මසදී සිදු කරන ලදී.


එම සමීක්ෂණය අනුව කොවිඩ් -19 වසංගතයට පෙර පොදු ප්‍රවාහන භාවිතා කළ නිළධාරීන්ගෙන් 10% පමණ කොවිඩ්-19 වසංගතයෙන් පසු පෞද්ගලික ප්‍රවාහන මාධ්‍ය වෙත යොමු වී ඇති බව හඳුනා ගැනීමට හැකිවිය.

ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නාරාහේන්පිට, බත්තරමුල්ල වැනි රජයේ හා පෞද්ගලික කාර්යාල බහුලව ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ වලට දිවයිනේ විවිධ ප්‍රදේශ වල සිට කාර්යාල ප්‍රවාහන සේවා බස්රථ යෙදවීමට සැලසුම් කළ අතර ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නාරාහේන්පිට නගරය කේන්ද්‍ර කරගනිමින් කුරුණෑගල, හලාවත, රත්නපුර වැනි ප්‍රදේශ වෙත අන්තර් පළාත් කාර්යාල ප්‍රවාහන සේවා ආරම්භ කරන ලදී. මෙම සැලසුම අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බත්තරමුල්ල නගරය කේන්ද්‍ර කර ගනිමින් නව බස්රථ සේවා ආරම්භ කිරීම සිදු කරන ලදී.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභා අරමුදලින් පුනරාවර්තන වියදම් යටතේ) රුපියල් මිලියන 3 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.108 ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 3.6 ක් වේ.

## 2.05 දුරගමන් සේවා සීමිත නැවතුම් සංඥා පුවරු සවිකිරීම



අන්තර් පළාත් දුරගමන් සේවා බස්රථ සෑම බස් නැවතුමකම නවත්වමින් කෙටිදුර ගමන්ගන්නා මගීන්ද රැගෙන ධාවනය කිරීම නිසා පළාත්බද ධාවනය වන බස්රථ සේවා සමග ඇතිකරගන්නා අහිතකර තරඟය වැළැක්වීමට, දුරගමන් සේවා බස්රථ නවත්වා මගීන් නංවා ගැනීම සඳහා සීමිත නැවතුම් ස්ථාන හඳුන්වා දීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

පෞද්ගලික බස්රථ ධාවකයින් සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිළධාරීන් සමග සාකච්ඡා කර මාර්ගයෙන් මාර්ගයට දුර සේවා නැවතුම් ස්ථාන තිරණය කරනු ලබන අතර එම ස්ථාන මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව, ශ්‍රී ලංකා පොලීසිය, අදාළ පළාත් ප්‍රවාහන අධිකාරිය හා ජාතික ගමනාගමන කොමිෂන් සභාව යන ආයතන වල නිළධාරීන්ගෙන් සමන්විත කමිටුව මගින් භෞතිකව පරීක්ෂා කර සීමිත නැවතුම් සංඥා පුවරු සවිකළ යුතු ස්ථාන නිශ්චිතව හඳුනාගනු ලැබේ.

**භෞතික ප්‍රගතිය**

2021 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව කොළඹට පිවිසෙන ප්‍රධාන පිවිසුම් මාර්ග 05 ක් ආවරණය වන පරිදි සීමිත නැවතුම් සංඥා පුවරු 500ක් සවිකිරීමට සැලසුම් කරන ලදී. නමුත් කොවිඩ් -19 වෛරස් වසංගත හේතු කොටගෙන කාර්යාලීය කටයුතු සීමා වීම නිසා කොළඹ - කතරගම, කොළඹ -ඇඹිලිපිටිය (පහළ පාර -Low Level හා ඉහලපාර -High Level ආවරණය වන පරිදි) සහ කොළඹ - මහනුවර දක්වා සීමිත නැවතුම් සංඥාපුවරුව සවිකළ යුතු ස්ථාන හඳුනා ගන්නා ලදී. ඒ අනුව 2021.12.31 දින වන විට සීමිත නැවතුම් සංඥා පුවරු 300 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලදී. නමුත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2021 වර්ෂයේ අපේක්ෂිත අරමුදල් සපයා ගැනීමට නොහැකි වූ හෙයින් මෙම ව්‍යාපෘතිය ඉදිරි වසර සඳහා කල් දමන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ සියයට 50 භෞතික ප්‍රගතියක් ළගා කර ගැනීමට හැකිවිය.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන වියදම් යටතේ ) රුපියල් මිලියන

10.5 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.079 ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 0.75 ක් වේ.

**2.06 ශ්‍රී ලංගම හා පෞද්ගලික බස්රථ සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම.**

2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතින් සංශෝධිත ජාතික ගමනාගමන මණ්ඩල පනත අනුව "විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහනක් මත ඇත්ත වශයෙන් වූ මගී ඉල්ලීම් සපුරාලීම සඳහා ප්‍රවීන රාජ්‍ය බස් සේවයක් හෝ පෞද්ගලික බස් සේවයක් ලබා දීම" අරමුණු කර ගනිමින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සහ පෞද්ගලික බස්රථ සඳහා පොදු කාලසටහන් සකස් කරනු ලැබේ.

එසේම අතිගරු ජනාධිපතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව "ගමනාගමන මණ්ඩලය සහ පෞද්ගලික බස්රථ ඒකාබද්ධව තරඟකාරීත්වයකින් තොරව සාධාරණව ආදායම් උපයාගත හැකිවන ලෙස පොදු කාලසටහනක් යටතේ සෑම මාර්ගයකටම දවසේ පැය 24 පුරා ක්‍රියාත්මකවන ප්‍රවාහන සේවාවක් ලබාදීමට කටයුතු කරනු ඇත". යන්න කෙරෙහි 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී විශේෂ අවධානය යොමු කරන ලදී,

බස්රථ අතර හා පවතින අහිතකර තරඟය අවමකර රාජ්‍ය හා පෞද්ගලික අංශය වෙත හා පෞද්ගලික අංශයේ තනි තනි මගීසේවා අවසර පත්‍ර හිමියන් වෙත නිශ්චිත වූ වෙළදපොළ කොටස වෙන්කරදීම තුලින් හිතකර තරඟකාරීවයක් (ගුණාත්මක තරඟයක්) ඇතිකර මහජනතාවට විශ්වසනීය, ආරක්ෂිත, සුවපහසු බස්රථ සේවාවක් සැපයීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

**මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය**

ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම කඩිනම් කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව ඇතුළු ආයතන වල නිළධාරීන්ගේ සමාජිකත්වයෙන් සහ වාහන නියාමන, බස්රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත්කරන ලදී.
ඒ අනුව 2021 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව මාර්ග 100 ක් සඳහා අන්තර් පළාත් බස්රථ ධාවනය වන මාර්ග සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව සැලසුම් කරනලදී.
නමුත් කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතු කොටගෙන 2021 මැයි මස 10 වන දින සිට පළාත් අතර සංචරණ සීමා පැනවීමත් සමග අන්තර් පළාත් බස්රථ ධාවනය අත් හිටුවන ලදී. යළිත් නොවැම්බර් මස 01 දින අන්තර් පළාත් බස්රථ ධාවනය ආරම්භ කිරීමත් සමඟ එදින සිට අභියාචනා අධිකරණයේ තීන්දුවක් මත බදුල්ල -කොළඹ (මාර්ග අංක 99 ) ඔස්සේ ධාවනය වන ශ්‍රී ලංගම සහ පෞද්ගලික බස්රථ සඳහා ඒකාබද්ධ කාලසටහන සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

මාර්ග අංක 87 ඔස්සේ කොළඹ සිට හලාවත, පුත්තලම හරහා අනුරාධපුරය, මන්නාරම, වව්නියාව, මුලතිව් වැනි නගර කරා ධාවනය වන සියළුම බස්රථ සේවා සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස්කිරීම සිදු කරන ලදී.

නමුත් කොවිඩ් -19 වෛරස් වසංගතය හේතු කොටගෙන සංචරණ සීමා පැනවීම නිසා අන්තර් පළාත් බස්රථ ධාවනය සීමාවීම් හේතු කොටගෙන ඉලක්ක කළ සියළුම සේවා සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ අතර අධිවේගී මාර්ගවල ක්‍රියාත්මක සියළුම අන්තර් පළාත් බස් සේවාවල ඒක්බද්ධ කාලසටහන් මගී ඉල්ලුම අනුව ගලපා නැවත සකස් කිරීම 2021 වර්ෂයේදී සිදුකරන ලදී. තවද, මෙම ව්‍යාපෘතිය කඩිනම් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවනු ලබන කමිටුවක් මගින් කාලසටහන් සකස්කිරීම කෙරෙහි ප්‍රවාහන හා ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශ වල අවධානය යොමු වී ඇත. මේ සම්බන්ධයෙන් පළාත් ප්‍රවාහන අධිකාරී දැනුවත් කිරීමේ සාකච්ඡාවක්ද මෙම වසරේ පවත්වන ලදී.ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 30 ක් වේ.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (පුනරාවර්තන වියදම්) යටතේ රුපියල් මිලියන 1 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.054 ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 5.4 ක් වේ.

### 2.07 බස් ගාස්තු සංශෝධනය සහ ගාස්තු විෂමතා ඉවත් කිරීම

2002 වර්ෂයේ සිට ක්‍රියාත්මක ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් වාර්ෂික බස් ගාස්තු නිර්ණය කිරීම සිදුකරනු ලැබේ. මෙම ගාස්තු ප්‍රතිපත්තිය අනුව බස් ගාස්තු නිර්ණය කිරීමේ පිරිවැය සංරචකය අනුව බස්ගාස්තු සංශෝධනය කළ යුතු බව පෙනී යන්නේ නම් සෑම වසරකම ජූලි මස 01 දින බස්ගාස්තු සංශෝධනය කළ යුතු අතර ඊට අමතරව ඉන්ධන මිල සමස්ත කි.මී. 01 ක පිරිවැය 4% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් ඉහල නැංවීමට දායකවූ අවස්ථාවක අන්තර්වාර බස්ගාස්තු සංශෝධන සිදුකරනු ලැබේ.

මෙම බස්ගාස්තු ප්‍රතිපත්තිය යාවත්කාලීනකර නව ගාස්තු ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ කමිටුවක් පත්කර ඇත.

**භෞතික ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ වාර්ෂික බස් ගාස්තු සංශෝධනය, බස්ගාස්තු විෂමතා ඉවත් කිරීම, දැනට පවත්නා බස්ගාස්තු ප්‍රතිපත්තිය වර්තමානයට ගැලපෙන පරිදි යාවත් කාලීන කිරීම යන කාර්යයන් සිදු කිරීමට 2021 වර්ෂයේ සැලසුම් කරන ලදී. ඒ අනුව 2021 මැයි 30 දිනට පැවති මිල ගණන් හා සලකා සමස්ත කි.මී. 01 ක පිරිවැයෙහි වෙනස් වීම ගණනය කරන ලදී.

නමුත් කොවිඩ්-19 වෛරස් වසංගතය හේතුවෙන් බස්රථ ධාවනය විදිමත්ව සිදු නොවීම හා කොවිඩ් වසංගත දෙවන රැල්ල හමුවේ සෞඛ්‍ය උපදෙස් අනුව පොදු ප්‍රවාහන සාමාන්‍ය සේවා බස්රථවල ආසන ගණනට පමණක් මගීන් රැගෙන යායුතු බවට ගන්නා ලද තින්දුවට අනුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත 2020.11.11 දින සිට 20% විශේෂ බස්ගාස්තු වැඩිකිරීමක් සාමාන්‍ය සේවා බස්රථ සඳහා ලබාදුන් හෙයින් 2021 ජූලි 01 දිනට යෙදී තිබූ වාර්ෂික බස් ගාස්තු සංශෝධනය සිදු නොකරන ලදී.

නමුත් 2021 ජූනි මස 11 දින සහ 2021 දෙසැම්බර් මස 20 දින ඩීසල් මිල පිළිවෙලින් රු 7 /- කින් සහ රු. 10 /- කින් වැඩිවීම නිසා බස්රථ ධාවකයින් විසින් බස්ගාස්තු වැඩි කරන ලෙස කරන ලද ඉල්ලීමට අනුව අන්තර් වාර බස් ගාස්තු සංශෝධනයක් 2021 දෙසැම්බර් 29 දින ප්‍රකාශයට පත් කරන ලද අතර එහිදී වර්තමාන බස් ගාස්තුව සියයට 17.44 කින් ඉහල නැංවීමට තීරණය කරන ලදී. ඒ අනුව පළමු ගාස්තුව රු 17.00ක් වන පරිදි සහ අනෙකුත් ගාස්තු අවස්ථා සියයට 17.44 කින් වැඩිකර නව බස් ගාස්තු සංශෝධනය 2022 ජනවාරි 05 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

ඌව පළාත හා සබරගමු පළාත තුළ ධාවනය වන ශ්‍රී ලංගම හා පෞද්ගලික බස්රථ සේවා වල බස්ගාස්තු විෂමතා ඉවත් කිරීම සිදු කිරීමට ඌව පළාත් ප්‍රවාහන අධිකාරියට, සබරගමු පළාත් ප්‍රවාහන අධිකාරිය හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත උපදෙස් නිකුත් කිරීම 2021 වර්ෂයේ සිදුකරනලදී. ඒ අනුව ඌව පළාත් ප්‍රවාහන අධිකාරිය විසින් අදියර කිහිපයක් යටතේ බස්ගාස්තු විෂමතා ඉවත් කිරීමට කටයුතු කරන බව ජාතික ගමනාගමන කොමිෂන් සභාවට දැනුම් දී ඇත.

නැගෙනහිර හා උතුරු පළාතේ බස්ගාස්තු විෂමතා ඉවත්කිරීම සඳහා මැනීම් කරන ලද තොරතුරු රැස්කිරීම සහ උතුරු මැද පළාතේ මාර්ගවල මැනීම් කටයුතු සිදුකිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත්කිරීම 2021 වර්ෂයේදී සිදු කරන ලදී.එම මැනීම් කටයුතු 2022 වර්ෂයේ සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

දැනට ක්‍රියාත්මක ජාතික බස්ගාස්තු ප්‍රතිපත්තිය වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලින කර නව බස්ගාස්තු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට අදාළ සමීක්ෂණ කොවිඩ් -19 වෛරස් වසංගත තත්ත්වය හේතු කොටගෙන තවදුරටත් කල්දැමීමට සිදුව ඇති හෙයින් ප්‍රවාහන අමාත්‍යාංශයේ මගපෙන්වීම අනුව එම සමීක්ෂණයෙන් රැස්කිරීමට තීරණය කළ දත්ත බස්රථ හිමියන්ගෙන් ලබාගෙන දැනට පවත්නා බස්ගාස්තු ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමේ කටයුතු තාවකාලිකව සිදු කිරීමට මේ සම්බන්ධයෙන් පත්කර ඇති කමිටුව විසින් තීරණය කරන ලදී.

ඒ අනුව සමීක්ෂණ පෝරමය සකස් කර එකගතාවය ලබාගැනීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කළ අතර ප්‍රවාහන අමාත්‍යාංශය විසින් කමිටු සාමාජිකයින් වෙත යොමු කරන ලදී. ඒ අනුව මගීන්ගේ ගමනාගමන කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත්වූ පසු මාර්ග 100 සමීක්ෂණ සිදු කර දැනට පවත්නා බස්ගාස්තු ප්‍රතිපත්තිය යාවත්කාලීන කර ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව මෙම ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 40 ක් වේ.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභා අරමුදල් වලින් පුනරාවර්තන වියදම් යටතේ) රුපියල් මිලියන 2 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.026 ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 1.3 ක් වේ.

## 2.08 ප්‍රවාහනය සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්

ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම අරමුණ කරගනිමින් පහත දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් දීප ව්‍යාප්තව පළාත් කේන්ද්‍ර කොට තෝරාගත් ස්ථානයන්හි ක්‍රියාත්මක කිරීමට 2021 වර්ෂයේදී සැලසුම් කරන ලදී.

- මාර්ග ආරක්ෂාව සම්බන්ධව පාසල් සිසුන් දැනුවත් කිරීම
- ප්‍රවාහන සැලසුම්කරණය
- කාලසටහන් සකස්කිරීම.
- කාර්යාලීය ක්‍රම සම්බන්ධව පළාත් ප්‍රවාහන අධිකාරීවල නිලධාරීන් දැනුවත් කිරීම
- බස්රථ ධාවනය, සේවක මණ්ඩල කළමනාකාරීත්වය, මගීසේවා අවසරපත්‍ර කොන්දේසි සම්බන්ධව බස්රථ ධාවකයින් දැනුවත් කිරීම
- මගී අයිතිවාසිකම් සම්බන්ධව මගීන් සහ බස්රථ රියදුරු කොන්දොස්තර මහතුන් දැනුවත් කිරීම

**භෞතික ප්‍රගතිය**

පවතින වසංගත තත්ත්වය යටතේ මහජනතාව රැස්කර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා සීමා පැන වූ හෙයින් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් පෙරගෙවුම් කාඩ්පත සම්බන්ධයෙන් මගීසේවා අවසරපත්‍ර හිමියන් දැනුවත් කිරීම පමණක් සිදුකළ අතර ඒ අනුව 2021.12.31 දින වන විට වැඩසටහන් 08 ක් පවත්වන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 80 ක් වේ.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන වියදම් යටතේ) රුපියල් මිලියන 1.5 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.24 ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 16 ක් වේ.

## 2.09 පොදු ප්‍රවාහන බස්රථ ක්ෂේත්‍රය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මහජනතාව වෙත සපයන සේවා වඩා කාර්යක්ෂම හා ඵලදායීව සිදු කිරීම සඳහාත් මගී ජනතාවට විශ්වසනීය, ගුණාත්මක, සුවපහසු පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් සැපයීම සඳහාත් දිනෙන් දින පොදු ප්‍රවාහන බස්රථ වලින් ඉවත්වන මගී ජනතාව නැවත

පොදු ප්‍රවාහන බස්රථ සේවාව වෙත ආකර්ශනය කරගැනීම සඳහාත් කාර්යාලීය කටයුතු සඳහා සහ පොදු ප්‍රවාහන බස්රථ සඳහා නව තාක්ෂණය හඳුන්වාදීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේදී විශේෂ අවධානයක් යොමුකර ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණික ඒකකය විසින් ආයතනයේ දෘඩාංග හා මෘදුකාංග පද්ධති සංවර්ධනය කිරීම, ස්ථාපනය කිරීම මෙන්ම ආයතනයේ කාර්යය පහසු කරගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික මැදිහත්වීම් සිදුකිරීම මෙම අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් වේ. මෙම තොරතුරු තාක්ෂණික ඒකකය හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති ගණනාවක් පවතින අතර, එම ව්‍යාපෘති වල 2021 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

<u>**ආයතනික ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය**</u>






ආයතනික කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම පරිගණක මෘදුකාංගයක් හරහා සිදුකිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. මෙම ව්‍යාපෘතියේදී ආයතනයේ පවතින ධාවන, සැලසුම් හා තත්ත්ව ආරක්ෂණ යන දෙපාර්තමේන්තු වල සිදුකරනු ලබන කාර්යයන් හඳුනාගෙන එම කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම කාණ්ඩ 03ක් යටතේ සිදුකරන ලදී. ඒ තුළින් මහජනතාවට ඉක්මන් සේවාවක් ලබාදීමටත්, ආයතනයේ ලිපිගොනු කටයුතු ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදයක් හරහා සිදුකිරීමෙන් වඩා විශ්වාසදායී ආරක්ෂාකාරී මෙන්ම කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම ද මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

මෙම එක් එක් පද්ධති ක්‍රියාත්මක වීමේදී මෙම පද්ධති හරහා කාර්යයන් සිදුකරන නිලධාරීන් මෙම ව්‍යාපෘතියට අනුගත කරගැනීම හා භාවිතා කරන්නන්ට වඩාත් පහසුකම් සහිතව (User Friendly) එම පද්ධතින් හැසිරවීමට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලදී. 2020 වර්ෂයේදී මෙම මෘදුකාංගය වඩාත් සුමටව භාවිතා කිරීමට අවශ්‍ය වූ ඒ ඒ දෙපාර්තමේන්තු විසින් ඉල්ලා ඇති සංශෝධන (Changes) සිදුකිරීමට වැඩි කාලයක් ගතකරන ලදී. එසේම මගී සේවා අවසරපත්‍රය වෙනුවට NFC කාඩ්පතක් නිකුත් කිරීමටද 2020 වර්ෂයේදී කටයුතු ආරම්භ කළ අතර, 2021 මාර්තු මස 05 වන දින එම කාඩ්පත එළිදක්වන ලදී. 2021 වර්ෂයේදී මෙම මෘදුකාංගය ක්‍රියාත්මක වීමේදී සිදුවන ගැටළු තත්ත්වයන් අවබෝධ කරගෙන එම ක්‍රියාවලියන් වඩා සුමට කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග

ගන්නා ලදී. Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් ආයතනයේ පවතින මූල්‍යමය අස්ථාවරත්වය නිසා මෙම ව්‍යාපෘතියට අදාළ දෘඩාංග මිලදී ගැනීමට නොහැකි විය.

ඒ අනුව ආයතන ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලියේ පළමු අදියර නිමකර ඇති අතර ක්‍රියාත්මක කිරීමේ දී හඳුනාගන්නා ලද කුඩා වෙනස්කම් තවදුරටත් සිදුකරමින් පවතී. එහි දෙවන අදියර ආරම්භ කිරීම සම්බන්ධව සහසර ව්‍යාපෘතිය හා එක්ව කටයුතු කිරීම අධ්‍යයනය කරමින් පවතී.

- **ගූගල් තාක්ෂණය ඔස්සේ පොදු ප්‍රවාහන සේවා හඳුන්වා දීම (GTFS)**

ගූගල් සිතියම තුළට පොදු ප්‍රවාහන සේවා ඇතුළත් කිරීම 2019 වර්ෂයේදී සිදුකළ අතර, එම ව්‍යාපෘතියේ තවත් දිගුවක් වශයෙන් සියලු පළාත් ප්‍රවාහන අධිකාරීන්ගේ බස්රථ ගමන් මාර්ග මෙම ව්‍යාපෘතියට ඇතුල් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකළ නමුත් මෙම කොවිඩ් -19 අභියෝගය හමුවේ වසංගත තත්ත්වය තුළ 2021 වර්ෂය තුළ සැලසුම් කරන ලද ඉලක්ක කරා යා නොහැකි වුවද දකුණු පළාත් ප්‍රවාහන අධිකාරියේ මාර්ග 71ක් ගූගල් සිතියමට ඇතුළත් කරන ලදී.



- **මාර්ගගත ක්‍රමයෙන් බස්රථවල ආසන වෙන් කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ අන්තර් පළාත් බස්රථ වල ගමන්ගන්නා මගීන් කල් ඇතිව ආසන වෙන් කිරීම මාර්ගගත ක්‍රමයෙන් සිදු කිරීමට අවශ්‍ය මෘදුකාංග සංවර්ධනය කිරීම 2021 වර්ෂයේදී සැලසුම් කරන ලදී. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව යටතේ පරිපාලනය වන කොළඹ බැස්ටියන් මාවත බස්නැවතුම්පලින් ආරම්භ වන බස්රථ වල ආසන කල් ඇතිව වෙන්කිරීම මාර්ගතව සිදුකිරීමේ පහසුකම 2021.12.31 දින වන විට මහජනතාව වෙත ලබාදෙන ලදී. මෙම පහසුකම සියළුම බස් පර්යන්ත වෙත ව්‍යාප්ත කිරීම සඳහා මාර්ගගත ක්‍රමයෙන් ආසන වෙන් කිරීමේ ව්‍යාපෘතිය පළාත් අධිකාරි හා සම්බන්ධ වී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු මේවන විට සිදුකරමින් පවතී. මෙම ක්‍රියාවලියට අදාලව නඩත්තු කටයුතු සිදුකිරීමට ආයතනයක් තෝරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර system IPG provider ලෙස HNB බැංකුව ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ තෝරාගෙන ඇත.








## MyBusSL Application එළිදැක්වීම

සියලු මගීන්ට භාවිතා කළහැකි මයිබස් ඇප් එළිදැක්වීම 2020 වර්ෂයේ සිදුකිරීම තොරතුරු තාක්ෂණික අංශය ලබන ලද සුවිශේෂී ජයග්‍රහණයකි.







ජීපීඑස් තාක්ෂණය හරහා තමන්ට අවශ්‍ය බස්රථය තිබෙන ස්ථානය හඳුනා ගැනීම, බස්රථවල කාලසටහන හා බස් ගාස්තුව දැන ගැනීමට හැකිවීම, මෙම ඇප් එක හරහා ආසන වෙන් කිරීමේ පහසුකම ලබාදීම පමණක් නොව මගීන්ගේ පැමිණිලි මෙන්ම විමසීම්ද මෙම ඇප් එක හරහා ලබාදීමට අවශ්‍ය ආසන වෙන් කිරීමේ පහසුකම ලබාදීම පමණක් නොව මගීන්ගේ පැමිණිලි මෙන්ම විමසීම්ද මෙම ඇප් එක හරහා ලබාදීමට අවශ්‍ය පහසුකම ලබාදී තිබීම වැනි සුවිශේෂතා මෙම ඇප් එකෙන් සිදුකළ හැකියාව ඇත. මෙම මෘදුකාංගය සඳහා 2021 වර්ෂයට අදාළව 2021 වර්ෂයේදී තොරතුරු සන්නිවේදනය හා සන්නිවේදන නියෝජිත ආයතනය විසින් රාජ්‍ය අංශය සඳහා ලබාදෙන රන් සම්මානය ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත පිරිනමන ලදී.

**පොදු ප්‍රවාහන බස්රථ ක්ෂේත්‍රය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (පුනරාවර්තන වියදම්) යටතේ රුපියල් මිලියන 10ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 1.291

ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 13 ක් වේ.

## 2.10 බස්රථ සඳහා GPS සවිකිරීම



2021 වර්ෂයේ GPS සිම්පත් 222ක් නිකුත් කර ඇති අතර බස්රථ 20 ක GPS උපකරණ සවිකර ඇත. ඒ අනුව සමස්ථයක් වශයෙන් 2021.12.31 වන විට GPS ඒකකය හරහා බස්රථ 1,133 නියාමනය වන අතර, ඒ අනුව මුළු බස්රථ වලින් 37% ක් සඳහා GPS සවිකර අවසන් කර ඇත. ඒ අනුව MyBusSL යෙදුම හරහා GPS සවිකර ඇති බස්රථ සියල්ල සම්බන්ධ සජීවී තොරතුරු බස් මගීන්ට බලාගැනීමට හැකියාව පවතී.

| **සේවා වර්ගය** | බස්රථ සංඛ්‍යාව | GPS සවිකර ඇති සංඛ්‍යාව |
|---|---|---|
| අධි සුඛෝපභෝගී | 113 | 91 |
| සුඛෝපභෝගී | 589 | 556 |
| අර්ධ සුඛෝපභෝගී | 435 | 333 |
| සාමාන්‍ය සේවා | 1,915 | 153 |
| **එකතුව** | 3,052 | 1,133 |

මූලාශ්‍රය - තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව, ජාගකොස

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන වියදම් යටතේ) රුපියල් මිලියන 8 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 7.13 ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 89.1 ක් වේ.

## 2.11 ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කිරීම හා එළිදැක්වීම

ශ්‍රී ලංකා මහ බැංකුව, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ජාතික ප්‍රවාහන

වෛද්‍ය ආයතනය, ඇතුළු ප්‍රවාහනය සම්බන්ධිත ආයතනයක් වන CILT ආයතනය ආදී ආයතන රාශියකින් තොරතුරු හා දත්ත ඒකරාශීකර එම දත්ත විශ්ලේෂණයකර ඉතා ආකර්ෂණීය ලෙස සකස් කරනු ලබන 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව' 2010 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ෂයක් පාසා මුද්‍රිත ග්‍රන්ථයක් වශයෙන් භාෂා ත්‍රිත්වයෙන්ම එළිදක්වනු ලැබේ.

ප්‍රවාහනය පිළිබඳ පර්යේෂණ කරන, සැලසුම් සකස් කරන ආයතන හා විද්වතුන්ට මෙන්ම ප්‍රවාහනය පිළිබඳ අධ්‍යයන කටයුතුවල යෙදෙන අයට ගොඩබිම, සාගරය හා ගුවන් යන මාධ්‍ය තුන හරහා සිදුකරන සියළු ප්‍රවාහන කාර්යයන් පිළිබඳ තොරතුරු එකම ස්ථානයකින් ලබාගතහැකි මාධ්‍යයක් ලෙසද මෙම වාර්තාව පරිශීලනය කිරීමට හැකිවේ.




**භෞතික ප්‍රගතිය**

ප්‍රවාහන සංඛ්‍යාලේඛණ වාර්තාවේ 2019 වාර්තාව එළිදැක්වීම සහ 2020/2021 වර්ෂ දෙකට අදාළ වාර්තාව ලියා අවසන් කිරීම 2021 වර්ෂයේදී සැලසුම් කරන ලදී. පවතින වාතාවරණය තුළ 2019 ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව මෘදු පිටපතක් වශයෙන් එළි දැක්වීම ට ආයතනය තීරණය කළ අතර එහෙයින් 2019 වාර්තාව මෘදු පිටපතක් වශයෙන් පමණක් එළිදැක්වීම 2021 වර්ෂයේ සිදු කරන ලදී. 2020/21 වාර්තාවේ ඉංග්‍රීසි පිටපත ලියා අවසන් කිරීම ද මෙම වසර තුළදී සිදු කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 95 ක් වේ.

**මූල්‍ය ප්‍රගතිය**



මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදල් වලින් පුනරාවර්තන වියදම් යටතේ) රුපියල් මිලියන 3 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.084 ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 2.8 ක් වේ.

## 2.12 Park and Ride ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය




අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව කොළඹ නගරයේ හා තදාසන්න නගර වල කාර්යය බහුල වේලාවන්හිදී ඇතිවන මාර්ග තදබදය අවම කිරීම සඳහා තනි අතට දිවෙන සහ වටරවුම් සුඛෝපභෝගී බස් සේවා (Radial and Circular) හඳුන්වා දීම කෙරෙහි අවධානය යොමු කර Park and Ride City Bus සේවාව මාකුඹුර බහුවිධ භූවමාරු මධ්‍යස්ථානය මූලික කරගෙන ආරම්භ කිරීමට මූලික සමීක්ෂණ සිදු කර එහි වාර්තාව ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

ඒ අනුව එම වාර්තාවෙන් යෝජිත මාර්ග සඳහා (C001, C002) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බස්රථ ධාවනය ආරම්භ කළ අතර ඒ සඳහා කාලසටහන් සකස්කිරිම, ගාස්තුව තීරණයකිරීම සහ නැවතුම් ස්ථාන සලකුණුකිරිම හා සංඥා පුවරු සවිකිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභා විසින් සිදුකරන ලදි .


ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ යොජනාවකට අනුව පිළියන්දල -කොළඹ දක්වා ආරම්භ කිරීමට සැලසුම් කර ඇති City Bus සේවාවේ ධාවන කාල සමීක්ෂණ සිදුකිරීම එම මාර්ගය සඳහා කාලසටහන් සකස්කිරීම, බස් ගාස්තු තීරණයකිරීම සහ සීමිත නැවතුම් ස්ථාන හඳුනාගැනීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදුකරන ලදී. තවද කොළඹ නගරයට තදාසන්න නගරවල සිට කොළඹට පිවිසෙන ප්‍රධාන මාර්ග ඔස්සේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත Low Floor සුඛෝපභෝගී City Bus බස්රථ සඳහා බස් ගාස්තු සටහන් ලබාදීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (පුනරාවර්තන වියදම්) යටතේ රුපියල් මිලියන 1 ක් වෙන් කළ අතර කොවිඩ් -19 වසංගතය හේතු කොට ගෙන පොදු ප්‍රවාහන සේවා භාවිතා කිරීමට මහජනතාව බියක් දැක්වීම නිසා මෙවැනි සේවා සඳහා මහජනතාව යොමු නොවන බැවින් මෙම ව්‍යාපෘතියේ සැලසුම් කළ කාර්යයන් සිදු කිරීම තාවකාලිකව අත් හිටුවූ බැවින් 2021.12.31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා කිසිදු මුදලක් වැය වී නොමැත.

## 2.13 පෙරගෙවුම් කාඩ් ක්‍රමය (Electronic Fare Collection)



සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල වෙමින් ඕනෑම බස්රථයක භාවිතා කළ හැකි ඊ-ප්‍රවේශපත්‍ර ක්‍රමයක් (e-Ticketing System ) 2021 වර්ෂය තුළ හඳුන්වා දීමට සැලසුම් කරන ලදී. ඒ අනුව කටයුතු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වාදෙනු ලබන ජාතික ගමනාගමන කාඩ්පත් යෝජනාවලිය යටතේ ප්‍රවාහනයේදී භාවිතා කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන මාර්ගස්ථ පෙරගෙවුම් කාඩ්පතක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය Backend මෘදුකාංගය ලබාගැනීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ අදාල මෘදුකාංගය සකස් කිරීම සඳහා සුදුසු ආයතනයක් තෝරාගැනීම 2021 වර්ෂයේදී සිදුකරන ලද අතර, එහි ක්‍රියාවලිය සිදුවන ආකාරය සම්බන්ධවද සම්පූර්ණ චක්‍රීය පරීක්ෂණයක් (full cycle test) 2021 වර්ෂයේදී සිදුකරන ලදී. මෙහි නියමු ව්‍යාපෘතිය 2021 වර්ෂයේදී ගාල්ල-මාකුඹුර මාර්ගයෙන් ආරම්භ කිරීමට සැලසුමක් තිබුණද Covid-19 වසංගත තත්ත්වය හමුවේ බස්රථ ධාවනය නියමිත පරිදි සිදු නොවූ බැවින් නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 2022 වර්ෂය දක්වා කල් දැමීමට සිදුවිය.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් ප්‍රාග්ධන වියදම් යටතේ) රුපියල් මිලියන 8.6 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.008 ක් 2021.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 0.09 ක් වේ.

## 2.14 ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලශක්ති අවශ්‍යතාව සඳහා සූර්ය පැනල සවිකිරීම

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව ඉදිරි වසර 05 තුළ නිවාස, කාර්යාල සහ කර්මාන්තශාලා වහල මත සවිකරන සූර්යපැනල මාර්ගයෙන් බලශක්තිය උත්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමුකිරීමේ ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු කරමින්, විකල්ප බලශක්තියක් ලෙස සූර්යය බලශක්තිය භාවිතයෙන් සිදුකරන විදුලිබල උත්පාදනය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ වහලය මත සූර්යපැනල සවිකිරීමේ ව්‍යාපෘතියක් සැලසුම් කිරීම ආරම්භ කරන ලදී.

**භෞතික ප්‍රගතිය**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි උපදේශක ආයතන වලින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ තෝරා ගන්නා ලද NSolar Consultants (Pvt) ආයතනයෙන් ලබාදෙන ලද ශක්‍යතා වාර්තාවට අනුව සූර්යපැනල මගින් විදුලිය ලබාගැනීමට සුදුසුම ක්‍රමය "Net Accounting Scheme" වන හෙයින් එම ක්‍රමය යටතේ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ගොඩනැගිලි අංක 01හි වහලය මත සූර්යපැනල සවිකිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. මේ සඳහා ඇස්තමේන්තු ගත මුදල රු.මි. 21.0 ක් වන අතර සූර්යපැනල සවිකිරීමට සුදුසු අයුරින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වහලය සකස් කිරීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ලබාදී ඇති ඇස්තමේන්තුව අනුව රු.මි. 14.78 කි.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ සංශෝධිත අයවැයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභා අරමුදලින් ප්‍රාග්ධන වියදම් යටතේ ) රුපියල් මිලියන 15 ක් වෙන් කළ අතර මෙම ව්‍යාපෘතියේ සැලසුම් කළ කාර්යයන් සිදු කිරීම තාවකාලිකව අත්හිටුවූ බැවින් 2021.12.31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා කිසිදු මුදලක් වැය වී නොමැත.

## 3. ව්‍යාපෘති නොවන කාර්යයන්

### 3.01 මහජන පැමිණිලි

ගුණාත්මක මගී ප්‍රවාහනය සේවාවක් මගී ජනතාවට ලබාදීම සඳහා පොදු ප්‍රවාහන සේවාවේ හැසිරීම ඉතා සියුම්ව නිරීක්ෂණය කළ හැකි මාධ්‍යක් වශයෙන් මෙම සේවාවෙන් ලැබෙන මහජන ප්‍රතිචාර ඉතා වැදගත්වේ.




ඒ අනුව බස්රථවල ගමන්කරන මගීන් ඔවුන් ලබාගන්නා සේවාව සම්බන්ධව එම බස්රථවල සේවක කණ්ඩායම්හි හැසිරීම සම්බන්ධව යම් ගැටළුකාරී තත්ත්වයන් ඇති වුවහොත් ඒ සම්බන්ධව පැමිණිලි කිරීමට මහජන පැමිණිලි ඒකකයක් ආයතනය තුළ ස්ථාපිතකර ඇත. එහිදී පැය 24 ම දින 07 පුරාම ක්‍රියාත්මක වන ක්ෂණික ඇමතුම් ඒකකය, මගින් බස්රථ සේවා සඳහා වන පැමිණිලි ලබාගන්නා අතර, එම පැමිණිලි එම අවස්ථාවේදීම විමර්ශන ඒකකය වෙත යොමුකරනු ලබයි. පැමිණිල්ල ස්වයංකරණ පද්ධතියට එක්කළ වහාම පැමිණිලිකරුගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක් හරහා පැමිණිල්ලට අදාල විමසීම් අංකය යවනු ලැබේ.

මෙම ලැබෙන පැමිණිලි වලින් අන්තර් පළාත් බස්රථ සම්බන්ධව ලැබෙන පැමිණිලි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේම විභාග කරන අතර, පළාත් අධිකාරී බස්රථ සම්බන්ධව ලැබෙන පැමිණිලි එම අධිකාරීන් වෙත යොමුකරනු ලබයි. එසේම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහා ලැබෙන පැමිණිලි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත යොමුකරයි.

ක්ෂණික දුරකථන ඇමතුම් ඒකකය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමට අමතරව ලිපි, ෆැක්ස්, ඊ මේල් මගින් හා MyBus-SL යෙදුම, WhatsApp, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හා මුහුණුපොත හරහා මහජන පැමිණිලි ඉදිරිපත් කිරීම සිදුකරනු ලබයි.
ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අන්තර් පළාත් බස්රථ සම්බන්ධව යොමුකරනු ලබන පැමිණිලි සියල්ල සියුම්ව නිරීක්ෂණය කරන අතර, මෙම පැමිණිලිවල ස්වභාවය අනුව අවවාද කිරීම, සේවක මණ්ඩලවල සේවා අත්හිටුවීම්, පරිපාලන ගාස්තු අයකිරීම් වැනි ක්‍රියාමාර්ග මෙන්ම අවසරපත්‍ර ගමන්වාර අත්හිටුවීම් සහ සමහර අවස්ථාවලදී මගීසේවා අවසර පත්‍ර අවලංගු කිරීම් දක්වාද කටයුතු කරනු ලබයි.

**ප්‍රගතිය**


ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ක්ෂණික දුරකථන ඇමතුම, කොවිඩ්-19 වසංගතය හේතුකොටගෙන කාර්යාලය නොපැවැත්වූ දින වලද දවසේ පැය 24 පුරාම නිවසේ සිට ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. නමුත් 2021 වර්ෂයේදී කොවිඩ්_19 වසංගත තත්ත්වය හමුවේ පොදු ප්‍රවාහන සේවා නිසිපරිදි ක්‍රියාත්මක නොවූ බැවින් අනෙකුත් වර්ෂ වලට සාපේක්ෂව පැමිණිලි ලැබීමේ

අඩුවීමක් දක්නට ලැබේ. 2021 වර්ෂයට අදාල පැමිණිලි ලැබීමේ සංඛ්‍යාත්මක තොරතුරු වගුව පහත පරිදි වේ.

2021 වර්ෂයේ ජනවාරි මස 01 සිට 2021 දෙසැම්බර් මස 31 දක්වා විශමාචාර වර්ග අනුව ලද පැමිණිලි

| අනු අංකය | විස්තරය | සංකේත අංකය | ලද පැමිණිලි සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1 | වැඩිපුර ගාස්තු අය කිරීම/ ඉතිරි මුදල් ලබා නොදීම | SE04 | 361 | 16 |
| 2 | මගීන්ට ආචාරශීලී නොවීම | MN12 | 344 | 16 |
| 3 | නියමිත ප්‍රමාණයට වඩා වැඩි මගීන් රැගෙන යාම | MJ12 | 137 | 6 |
| 4 | නියමිත පරිදි ප්‍රවේශ පත්‍ර නිකුත් නොකිරීම | MJ11 | 314 | 14 |
| 5 | නොසැළකිල්ලෙන් රිය පැදවීම/අධික වේගය/ ජංගම දුරකථනය භාවිතා කිරීම/තරඟ කාරි ධාවනය/ සුළු අනතුරු | MJ17 | 427 | 20 |
| 6 | රියැදුරු / කොන්දොස්තර ප්‍රවීණතා කාඩ් පත නොමැතිව සේවයේ යෙදීම | MJ07 | 20 | 1 |
| 7 | අතරමග ස්ථානවල අනවශ්‍ය ආකාරයට බස්රථය නවත්වා මගීන් එකතු කිරීම | MN12-01 | 46 | 2 |
| 8 | නියමිත කාලසටහන උල්ලංඝනය කිරීම | MJ01 | 270 | 12 |
| 9 | නියමිත ස්ථානයෙන් ගමන් ආරම්භ නොකිරීම හා ගමනාන්තය දක්වා ධාවනය නොකිරීම | SE03 | 166 | 8 |
| 10 | බස් රථය මගී ප්‍රවාහනයට සුදුසු තත්ත්වයේ නොතබීම | MJ03 | 37 | 2 |
| 11 | වායු සමීකරණ නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම | MJ02 | 27 | 1 |
| 12 | අධික ශබ්දයෙන් කැසට්/ රේඩියෝ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම/ නොගැලපෙන වීඩියෝ පට ප්‍රදර්ශනය | MN02 | 40 | 2 |
| | **එකතුව** | | **2189** | **100** |

මූලාශ්‍රය - තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව, ජාගකොස




ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින දක්වා අන්තර් පළාත් පෞද්ගලික බස්රථවලදී මගී ජනතාව මුහුණදුන් විවිධ ගැටලු පාදක කරගෙන පැමිණිලි 1850ක් ඉදිරිපත්වී ඇති අතර, ඉන් වැඩිපුරම පැමිණිලි ලැබී ඇත්තේ අපරීක්ෂාකාරී රිය ධාවනය සම්බන්ධවයි.එය සංඛ්‍යාත්මක වශයෙන් පැමිණිලි 427 කි.

පසුගිය වසර හා සැසැදීමේදී සමස්ත පැමිණිලි ලැබීම් අඩු අගයක් ගත්තද කොඩිඩ් -19 වසංගත තත්ත්වය හමුවේ පොදු ප්‍රවාහන බස්රථ ධාවනය නොවීම නිසා මෙම අගය අඩු වී ඇති බව පැහැදිලි වේ.

ලැබෙන පැමිණිලි සියල්ල විමර්ශනයට ලක්කර බස් හිමිකරුවන්ට,සේවක මණ්ඩලයට අවවාද කිරීම්,පරිපාලන ගාස්තු අයකිරීම්,පුහුණුවට යොමු කිරීම් හා මගීසේවා අවසරපත්‍ර අත්හිටුවීම් වැනි ක්‍රියාමාර්ග ගනු ලබයි.

තවද අන්තර් පළාත් පෞද්ගලික බස්රථ වලින් සිදුකරනු ලබන මාරක අනතුරු සම්බන්ධව ජාතික ගමනාගමන කොමිෂන් සභාව දැඩි ක්‍රියාමාර්ග ගනු ලැබේ. මාරක අනතුරක් වාර්තාවූ වහාම බස්රථයේ ධාවනය අත්හිටුවා පරීක්ෂණ කටයුතු ආරම්භකරන අතර අධිකරණ වාර්තා හා පොලිස් වාර්තා අනුව මෙම අවසරපත්‍ර අවලංගුකිරීම් හා මාරක අනතුර සිදුකළ රියදුරන්ට නැවත පොදු ප්‍රවාහන සේවා බස්රථවල සේවය කිරීමට නොහැකි වන ආකාරයට සේවා ලියාපදිංචිය අවලංගු කර අසාදු ලේඛණගත කිරීම සිදුකරනු ලැබේ.

### 3.02ජංගම පරීක්ෂණ හා විමර්ශන

ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව අන්තර් පළාත් මගී ප්‍රවාහන පෞද්ගලික බස්රථ සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ. එම අවසරපත්‍ර යටතේ ධාවනය කරනු ලබන බස්රථ සඳහා කොන්දේසි මාලාවක් පනවා ඇති අතර එම කොන්දේසිවලට අනුකූලව බස්රථ ධාවනය කරන්නේද යන්න පරීක්ෂා කිරිම, ජංගම පරීක්ෂණ ඒකකය විසින් සිදුකරනු ලබයි. එම පරීක්ෂණ වලදී අවසරපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් අන්තර් පළාත් බස්රථ ධාවනය කරන බවට අනාවරණය වුවහොත් අදාල බස්රථ පිළිබඳව විමර්ශනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනුලැබේ. මෙම සේවාවේ ප්‍රධාන අරමුණ වන්නේ ගුණාත්මක සේවාවක් මගී ජනතාවට ලබාදී පොදු ප්‍රවාහනය සඳහා වැඩි මගී ප්‍රමාණයක් ආකර්ශනය කරගැනිම වේ.

**ප්‍රගතිය**

ජංගම පරීක්ෂණ අංශය මගින් මාර්ගස්ථව පරීක්ෂා කරනු ලබන බස්රථ වලින් හඳුනාගන්නා කොන්දේසි කඩකිරීම් සඳහා පරිපාලන ගාස්තු අයකිරීම, පුහුණුවීම් සඳහා යොමුකිරීම, මගී සේවා අවසර පත්‍ර අත්හිටුවීම මෙන්ම අවලංගු කිරීම් සිදුකිරීමද මේ ඒකකය යටතේ සිදුකරනු ලබයි. 2021 වර්ෂයේ පැවැති කොවිඩ්- 19 වසංගත තත්ත්වය හමුවේ ජංගම පරීක්ෂණ යෙදවීම් සිදුකිරීම සීමා වූ අතර, ඒ අනුව 2021 වර්ෂයේ විමර්ශනය කරන ලද කොන්දේසි කඩකිරීම් ගණන 1220කි.


### 3.03 අන්තර්පළාත් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම

කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ 2021 වර්ෂයට නව මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම් සිදු නොකළ අතර පවතින අවසරපත්‍ර යාවත්කාලීන කිරිම පමණක් සිදු කරන ලදී.

2021.12.31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වලංගු මගීසේවා අවසරපත්‍ර සංඛ්‍යාව පහත වගුවෙහි දැක්වේ.

| අනු අංකය | සේවා වර්ගය | බස්රථ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සාමාන්‍ය | 1,978 |
| 2 | අර්ධ සුඛෝපභෝගී | 433 |
| 3 | සුඛෝපභෝගී | 598 |
| 4 | අධි සුඛෝපභෝගී | 126 |
| **එකතුව** | | **3,135** |

මූලාශ්‍රය - ධාවන දෙපාර්තමේන්තුව, ජාගකොස




### 3.04 2015 වර්ෂයේ සිට තාවකාලික අවසරපත්‍ර මත දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා බස්රථ ධාවනය කරන මගී සේවා අවසරපත්‍ර හිමියන්ට නිත්‍ය මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය, නීතිපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් අනුමැති,උපදෙස් සහ උක්ත කරුණ සම්බන්ධයෙන් බස්රථ හිමියන් විසින් ගොනුකර තිබූ නඩු වල සමථය ප්‍රකාරව උක්ත බස්රථ හිමියන් වෙත නිත්‍ය මගීසේවා අවසර පත්‍ර නිකුත් කිරීම 2021 දෙසැම්බර් මස 16 දින ආරම්භ කළ අතර 2021.12.31 දින වන විට නිත්‍ය මගීසේවා අවසර පත්‍ර 15 ක් නිකුත් කරන ලදී.

### 3.05 මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ බස්රථ සේවා වැඩි දියුණු කිරීම.

මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් උපරිම අයුරින් මහජනතාවට ප්‍රයෝජන අවස්ථාව ලබාදීමද අරමුණු කරගනිමින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ දැනට සුඛෝපභෝගී සේවාව යටතේ නිතුක්කර ඇති මගී සේවා අවසරපත්‍ර හිමි අතිරික්ත බස්රථ තාවකාලික අවසරපත්‍ර යටතේ මාර්ග සංශෝධනය කර මාකුඹුර සිට දිවයිනේ ප්‍රධාන නගර දක්වා ධාවනයේ යෙදවීමට සැලසුම් කිරීම මෙම වසරේ සිදු කරන ලදී.

### 3.06 නිත්‍ය මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම

2005, 2014, 2016, 2017 වර්ෂවලදී මගීසේවා අවසරපත්‍ර නිකුත්කිරීම සඳහා ලබාදී තිබූ සියළු අමාත්‍ය මණ්ඩල අනුමැතින් අවලංගුකර අන්තර් පළාත් මාර්ග සඳහා නිත්‍ය මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් විද්වත් කමිටුවක් පත්කරන ලදි.

ඒ අනුව එම විද්වත් කමිටුවේ වාර්තාව සකස්කර ප්‍රවාහන අමාත්‍යාංශය වෙත භාරදෙන ලදී. එම වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලදුව එම විද්වත් කමිටුවේ වාර්තාව සැලකිල්ලට ගෙන විමර්ශනය කර වාර්තාවක් ලබා දෙන ලෙසට අමාත්‍ය මණ්ඩලය විසින් දන්වා ඇත.

### 3.07 දිර්ඝ කාලීනව අවලංගුව් ඇති මගීසේවා අවසරපත්‍ර නැවත වලංගු කරදෙන ලෙසට ලැබෙන අභියාචනා

ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාරව කිසියම් මගීසේවා අවසරපත්‍රයක් අවලංගු කර ඒබව අවසරපත්‍රලාභියා වෙත දැනුම් දිමෙන් පසු එම දින සිට දින 14ක් තුල අභියාචනාවක් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර යුතු අතර ලේකම් විසින් ලබා දෙන ලබන තිරණය අනුව කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබිය යුතුය. එහෙත් දිර්ඝ කාලිනව අවලංගුවූ මගී සේවා අවසරපත්‍ර යලි වලංගු කරන ලෙසට අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කරනු ලැබේ. ඒ අනුව 2021.12.31 දින වන විට අමාත්‍යාංශ ලේකම් විසින් මගීසේවා අවසරපත්‍ර 15ක් නැවත වලංගු කරන ලෙසට නියෝග ලබාදී ඇති අතර එයින් මගීසේවා අවසරපත්‍ර 05ක් නැවත වලංගු කිරීමට 2021 වර්ෂයේදී කටයුතු කර ඇත.

### 3.08 ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

කාලීන අවශ්‍යතාවය සලකා බලමින් ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ සහ ගරු ප්‍රවාහන ලේකම්තුමන්ගේ උපදේශය මත අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලබාගැනීමෙන් අනතුරුව 1991 අංක 37 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතෙහි වගන්තින් කිහිපයක් සංශෝධනය කිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. 2021.12.31 දින වන විට අදාල සංශෝධිත පනත් කෙටුම් පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

1991 අංක 37 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතෙහි සංශෝධනය වන ප්‍රධාන වගන්ති

4. 28 වන වගන්තිය යටතේ මගී සේවා අවසරපත්‍ර අයිතිය විධිමත් කිරීමට අදාල ප්‍රතිපාදන
5. 31 වන වගන්තිය යටතේ මගීසේවා අවසරපත්‍ර අලුත් කිරීමට අදාල ප්‍රතිපාදන
6. 40 වන වගන්තිය යටතේ දඩ මුදල් ඉහල දැමීමට අදාල ප්‍රතිපාදන

තවද මෙම සංශෝධනය මගින් මගී ප්‍රවාහනයේ යෙදෙන ත්‍රීරෝද රථ සඳහා රෙගුලාසි සකස් කිරීම, පාසැල් දරුවන් ප්‍රවාහනය කරන පාසැල් බස්රථ හා වෑන්රථ සඳහා රෙගුලාසි සකස් කිරීම, කාර්යාල ප්‍රවාහන සේවා වශයෙන් මගී ප්‍රවාහනයේ යෙදෙන වාහන සඳහා රෙගුලාසි සකස් කිරීම, ජාගකොස විසින් නිකුත් කර ඇති මගීසේවා අවසර පත්‍ර පැවරීම සඳහා කටයුතු කිරීම වැනි නව කාර්යයන් කීහිපයක් ඇතුලත් කර ඇත.

### 3.09 කෝවිඩ් - 19 ව්‍යවසනය හමුවේ පිඩාවට පත් මගී සේවා අවසරපත්‍ර හිමියන්ට සහන ලබාදීම

කොවිඩ්-19 වසංගත තුන්වන රැල්ල ආරම්භ වීමත් සමග 2021 වර්ෂයේ පළමු කාර්තුවෙන් පසුව මගී ප්‍රවාහන ක්ෂේත්‍රයටද දැඩි බලපෑම් එල්ල විය. කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය හා ආරක්ෂක අංශ විසින් වරින්වර සංචරණ සීමා හා නිරෝධායන ඇදිරි නීතිය පැනවීම් හේතුවෙන් 2021 මැයි මස 10 දින සිට 2021 ඔක්තෝබර් 30 දින දක්වා අන්තර් පළාත් බස්රථ සේවා අඛණ්ඩව ධාවනය කිරීමට අවස්ථාව හිමි වූයේ නැත.

එසේම පොදු ප්‍රවාහනය භාවිතා කරන මගීන්ගේ අඩුවීම හේතුවෙන් දෛනික ධාවනය කරනු ලබන බස්රථ සංඛ්‍යාවද අඩු විය. එසේම ධාවනය කරන ලද බස්රථවල ගමන් කළ මගීන් සංඛ්‍යාවේ අඩුවක්ද දකින්නට ලැබිණි. මේ හේතුවෙන් ඇතැම් බස්රථ හිමියන්ට තම දෛනික පිරිවැය හෝ ආවරණය කර ගැනිමට නොහැකි බවට බස් හිමියන්ගේ සංගම් හා බස්රථ හිමියන් විසින් කරුණු දක්වන ලදී.

එසේම ඇතැම් බස්රථ දිර්ඝ කාලයක් ධාවන කටයුතුවලින් ඉවත්ව තිබීම හේතුවෙන් එම බස්රථ නැවත ධාවනයට එක් කිරීමේදි නඩත්තු කටයුතු සඳහා අමතර මුදලක් වියදම් කිරීමටද සිදුවන බව බස් රථ හිමියන්ගේ මැසිවිලි අතර ප්‍රධාන විය.
ඉහත කරුණු සලකා බලා ආයතනික මට්ටමින්, අමාත්‍ය මණ්ඩල තිරණ හා අතිගරු ජනාධිපතිතුමා සමඟ පැවැති සාකච්ඡාවලදි ගනු ලැබූ තිරණ මත මගී සේවා අවසරපත්‍ර හිමියන්ට සහන ලබාදිමට කටයුතු කර ඇත. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි,

2021 ජනවාරි සිට 2021 මාර්තු දක්වා -

- වාර්ෂික ටෙන්ඩර් ගාස්තුවෙන් 10% ක් පමණක් අය කිරිම,
- ලොග්පත්‍ර/ පිවිසුම් ගාස්තු අය නොකිරිම,
- අධිවේගී මාර්ගයේ තාවකාලික අවසරපත්‍ර ගාස්තුවෙන් 10% ක් පමණක් අය කිරිම
  වැනි සහන ලබාදෙන ලදී.

2021 අප්‍රේල් සිට 2021 සැප්තැම්බර් 30 දක්වා -

- වාර්ෂික ටෙන්ඩර් ගාස්තුවෙන් 50% ක් අය කිරිම,
- අධිවේගී මාර්ගයේ තාවකාලික අවසරපත්‍ර ගාස්තුවෙන් 50% ක් අය කිරිමට අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලදී. නමුත් 2021 වර්ෂයේ අප්‍රේල් මස අග සිට ආරම්භ වූ කොවිඩ් තුන්වැනි රැල්ල හේතුවෙන් ඉහත අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ගාස්තු අයකිරිම සිදු නොකළ අතර නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අනුව ඉහත අනුමත වූ අයකිරීම් සියල්ල නිදහස් කරන ලදී.

2021නොවැම්බර් 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා

අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අනුව

- වාර්ෂික ටෙන්ඩර් ගාස්තුවෙන් 25% ක් පමණක් අය කිරිමටත් ,

- අධිවේගී මාර්ගයේ තාවකාලික අවසරපත්‍ර ගාස්තුවෙන් 25% ක් පමණක් අය කිරිමටත් කටයුතු කරන ලදී.

මීට අමතරව

- ලංකා බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් සහනාදායි පොලී අනුපාතයට රු. 300,000.00ක ණය මුදලක් ලබාදීම ට අවශ්‍ය ඇපවීම් සහ සම්බන්ධීකරණ කටයුතු ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද අතර 2021.12.31 දින වන විට එම ණය මුදල ලබාගත් බස්රථ හිමියන් සංඛ්‍යාව 510 පමණ වේ.
- CEAT Kelani International Private Limited, Brown & Company PLC, Lanka Ashok Leyland, Chevron Lubricants Lanka PLC, LAUGFS Lubricants Limited, Diesel and Motor Engineering PLC සමාගම් සමග සාකච්ඡා කර බස්රථ අමතර කොටස්, ටයර්, ටියුබ්, ලිහිසිතෙල් සහ ඇතැම් උපාංග සහනදායි මිලකට ලබාගැනීමට රුපියල් ලක්ෂයත් ලක්ෂ දෙකත් ආසන්න වට්ටම් පහසුකම් යටතේ ලබාගැනීමට වවුචර්පත් නිකුත් කිරීම සිදු කරන ලදී.
  2021.12.31 දින වන විට අන්තර් පළාත් හා පළාත් බද බස්රථ හිමියන් 8000 කට පමණ මෙම වවුචර් පත්‍ර නිකුත් කර ඇත.

### 3.10 2021 වර්ෂයේ මාණ්ඩලික රැස්විම් හා විගණන හා කළමනාකරණ රැස්වීම්

| | |
|---|---|
| 2021 වර්ෂය තුළ පවත්වනු ලැබූ කොමිෂන් සභා රැස්වීම් සංඛ්‍යාව | 12 |
| 2021 වර්ෂය තුළදී පවත්වනු ලැබූ විගණන හා කළමනාකරණ රැස්වීම් සංඛ්‍යාව | 04 |

# වාර්ෂික ගිණුම්

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව** (ශ්‍රී ලංකා රුපියල් වලින්)

| දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහඋපකරණ | 4 | 385,284,936.64 | 404,898,856.29 |
| නොනිමි වැඩ | | 30,502,154.10 | 30,502,154.10 |
| පුස්තකාල පොත් | | 1,269,973.81 | 1,269,973.81 |
| **මුලු ජංගම නොවන වත්කම්** | | **417,057,064.55** | **436,670,984.20** |
| **ජංගම වත්කම්** | | | |
| ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම් | 5 | 11,959,500.90 | 7,169,144.60 |
| ලැබීම් - සේවක | 6 | 27,806,515.00 | 25,902,340.00 |
| ආයෝජන - කාලීන තැන්පත් | 7 | 44,842,369.40 | 42,053,092.41 |
| ආයෝජන - භාණ්ඩාගාර බිල්පත් | 8 | 15,645,319.00 | 14,935,680.00 |
| ලැබියයුතු පොළී ආදායම් | | 1,601,883.32 | 2,593,962.78 |
| මුදල් හා මුදල් සමාන දෑ | 9 | 382,818,404.76 | 517,262,715.21 |
| **මුලු ජංගම වත්කම්** | | **484,673,992.38** | **609,916,935.00** |
| **මුලු වත්කම්** | | **901,731,056.93** | **1,046,587,919.20** |
| **බැරකම්** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| රජයේ ප්‍රතිපාදන | 10 | 221,338,847.15 | 243,505,851.02 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 11 | 55,905,538.50 | 53,127,501.50 |
| **මුලු ජංගම නොවන බැරකම්** | | **277,244,385.65** | **296,633,352.52** |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු වියදම් | 12 | 1,572,067.70 | 1,870,484.93 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | | 55,608,904.00 | 57,231,404.00 |
| වෙන්කිරීම් හා උපචිත වියදම් | 13 | 91,610,135.84 | 108,861,458.62 |
| **මුලු ජංගම බැරකම්** | | **148,791,107.54** | **167,963,347.55** |
| **සමුච්චිත අරමුදල** | | **475,695,563.74** | **581,991,219.13** |
| **මුලු ශුද්ධ වත්කම් / හිමිකම්** | | **901,731,056.93** | **1,046,587,919.20** |

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය , ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කර ඇති බවට සහතික කරන ලදී.

.................................

**අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන)**

මූල්‍ය ප්‍රකාශන වල අංක 05 සිට 08 දක්වා පිටු වල දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා අංක 09 සිට 15 දක්වා පිටු වල දක්වා ඇති සටහන් වලට අනුගතව සකස් කර ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකියනු ලැබේ.

.................................

**සභාපති**

.................................

**කොමිෂන් සභාවේ සාමාජික**

දිනය: 2022.02.28

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් කාර්යඵලය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| ආදායම | | | |
| ආදායම | 14 | 87,847,302.74 | 190,209,342.70 |
| වෙනත් අදායම් | 15 | 45,782,225.01 | 59,158,570.54 |
| එකතුව | | 133,629,527.75 | 249,367,913.24 |
| **වියදම්** | | | |
| **මෙහෙයුම් වියදම්** | 16 | - | |
| සේවක පාරිශ්‍රමික | 16.1 | 147,636,781.23 | 154,981,118.13 |
| ප්‍රවාහන වියදම් | 16.2 | 12,149,681.55 | 12,870,202.08 |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | 16.3 | 945,725.50 | 1,481,487.25 |
| ආයතන වියදම් | 16.4 | 34,612,820.60 | 39,179,063.02 |
| ස්ථාවර වත්කම් අලුත්වැඩියා සහ නඩත්තු | 16.5 | 1,933,901.07 | 2,377,177.37 |
| සේවක සුභසාධනය | 16.6 | 6,786,605.51 | 6,815,970.98 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 16.7 | 216,610.00 | 632,618.72 |
| නීති හා වෙනත්ගාස්තු | 16.8 | 1,240,819.00 | 1,328,549.00 |
| සන්නිවේදන වියදම් | 16.9 | 572,145.55 | 759,279.00 |
| ක්ෂය වීම් | 16.10 | 20,385,908.04 | 27,094,770.24 |
| මූල්‍යගාස්තු | 16.11 | 44,171.20 | 39,174.18 |
| වෙනත් වියදම් | 16.12 | 829,885.14 | 1,699,189.90 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **227,355,054.39** | **249,258,599.87** |
| **වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)** | | **-93,725,526.64** | **109,313.37** |
| **මෙහෙයුම් නොවන ආදායම්** | 17 | **13,749.19** | **15,430.00** |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය (ඌණතාවය)** | | **-93,711,777.45** | **124,743.37** |
| **රජයෙන්ලැබුණු ප්‍රතිපාදන** | | | |
| ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රතිපාදන ලැබීම් | 18 | **271,000,000.00** | **401,999,970.00** |
| **විශේෂ ව්‍යාපෘති වියදම් (රජයේ ප්‍රතිපාදන)** | 19.1 | **271,000,000.00** | **401,999,970.00** |
| **විශේෂ ව්‍යාපෘති වියදම් (ජාගකොස ප්‍රතිපාදන)** | 19.2 | **12,583,877.94** | **24,868,092.93** |
| **වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)** | | **-106,295,655.39** | **-24,743,349.56** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම/හිමිකම වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | සමුච්චිත අතිරික්තය (ඌනතාවය) |
|---|---|
| **2020 ජනවාරි 01 දිනට ශේෂය** | 606,734,568.69 |
| අදාල වසර සඳහා අතිරික්තය/ ඌණතාවය | (24,743,349.56) |
| **2020 දෙසැම්බර් 31 දිනටශේෂය** | 581,991,219.13 |
| අදාල වසර සඳහා අතිරික්තය/ ඌණතාවය | (106,295,655.39) |
| **2021 දෙසැම්බර් 31 දිනටශේෂය** | 475,695,563.74 |

**(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)**

**ජාතික ගමනාගමනකොමිෂන් සභාව** *(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| වසර සඳහා අතිරික්තය / ඌණතාවය | | (106,295,655.39) | (24,743,349.56) |
| **මුදල් නොවන චලනයන්** | | | |
| ක්ෂය වීම් | | 20,385,908.04 | 27,094,770.24 |
| වත්කම් අපහරණය | | (13,749.19) | (15,430.00) |
| ක්‍රමක්ෂය | | (22,167,003.87) | (24,315,448.84) |
| වසර සඳහා පාරිතෝෂික වියදම | | 5,248,909.50 | 9,156,909.00 |
| පොළී අදායම | | (23,615,221.14) | (34,843,121.70) |
| **මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය - කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර** | | **(126,456,812.05)** | **(47,665,670.86)** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | |
| ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම් | | (4,790,356.30) | (1,087,039.38) |
| ලැබීම් - සේවක | | (1,904,175.00) | (1,524,177.00) |
| ලැබිය යුතු පොළී ආදායම | | 992,079.46 | 949,629.91 |
| ගෙවිය යුතු වියදම් | | (298,417.23) | (60,682,183.99) |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | | (1,622,500.00) | (2,472,000.00) |
| වෙන්කිරීම් හා උපචිත වියදම් | | (17,251,322.78) | 69,720,389.83 |
| **මෙහෙයුම් වලින් ජනිත වූ මුදල්** | | **(151,331,503.90)** | **(42,761,051.49)** |
| පාරිතෝෂික අරමුදල් ගෙවීම් | | (2,470,872.50) | (1,697,640.00) |
| වත්කම් අපහරණයෙන් ලද මුදල් | | 44,050.00 | 15,430.00 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | **(153,758,326.40)** | **(44,443,261.49)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (802,289.20) | (756,500.29) |
| කෙරීගෙන යන වැඩ | | - | 172,572.79 |
| කාලීන තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත් සඳහා ශුද්ධ ආයෝජන | | (3,498,915.99) | (4,848,108.11) |
| පොළී ලැබීම් | | 23,615,221.14 | 34,843,121.70 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | **19,314,015.95** | **29,411,086.09** |
| **මූල්‍ය ක්‍රියාකාරීත්වය තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| **වර්ෂය තුළ මූල්‍ය ක්‍රියාකාරීත්වය තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **-** | **-** |
| **වර්ෂය තුළ මුදල් හා මුදල් සමාන දෑහි ශුද්ධ වෙනස් වීම** | | **(134,444,310.45)** | **(15,032,175.40)** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | | 517,262,715.21 | 532,294,890.61 |
| **වර්ෂ අවසාන මුදල් සහ මුදල් සමාන දෑ** | සටහන 09 | **382,818,404.76** | **517,262,715.21** |

**(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)**

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 1 ඒකාබද්ධ තොරතුරු

**1.1 වාර්තාකරන ආයතනය**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 1991 අංක 37 දරණ ජාගකොස පනත යටතේ ස්ථාපනය කොට ඇත. කොමිෂන් සභාවේ කාර්යාලය සහ ගණුදෙනු සිදුකරනු ලබන ප්‍රධාන මධ්‍යස්ථානය කොළඹ 05 , උද්‍යාන පාරේ අංක 241 දරන ස්ථානයෙහි පිහිටුවා ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හී ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍යමය දත්ත ඇතුලත් වේ

**1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය**

කොමිෂන් සභාවේ කාර්යය වනු ඇත්තේ ඔම්නි බස් මගින් මගී ජනතාවට ප්‍රවාහන සේවාවන් සැලසීම පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් ලබාදීම සහ ඔම්නි බස් සඳහා නිශ්චය කර ගනු ලබන ප්‍රදේශ සඳහා මගී ප්‍රවාහන සේවා බලපත්‍ර නිකුත් කිරීම වේ.

**1.3** 2021 වර්ෂය අවසානය වන විට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ස්ථිර සේවක මණ්ඩලය 181 කි. එමෙන්ම කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 8 දෙනෙකු සේවය කර ඇත..

**1.4 වාර්තාකරන දිනය**

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ දිනය දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වේ.

**1.5 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය**

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය / සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධිකාරී බලය ලබා දී ඇත්තේ 2022.02.23 දිනය.

### 2 වැදගත් ගිණුම්කරන පිළිවෙත්හි සාරාංශය

**2.1 පිළියෙල කිරීමේ පදනම**

කොමිෂන් සභාවේ ගිණුම් පිළියෙල කරනු ලබන්නේ රාජ්‍ය අංශයේ ගිණුම් පිළිබඳ ප්‍රමිතීන් (SLPSASs) සහ පොදුවේ පිළිගනු ලබන ගිණුම්කරණ මූලධර්ම (LKAS 20) වලට අනුකූලවය. මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ ගත්මිල මත පදනම්ව වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා රජයේ ගිණුම් පිළිවෙත් අනුව ඇස්තමේන්තු මත සකස් කර ඇත.
ඉහත සඳහන් ක්‍රියාවලි අනුව ආයතනයේ තොරතුරු, සටහන්, ඇස්තමේන්තු ගිණුම්ගත කිරීමේදී ගිණුම්කරණ ක්‍රියාවලියෙන් පරිබාහිර, විශේෂිත හා සංකීර්ණ වූ අවස්ථාවන් ගිණුම්කරණයට ලක් කිරීමේදී එම අවස්ථාවට යොදාගනු ලබන උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳව සටහන් අංක 3 මගින් දක්වා ඇත.

**2.2 ගිණුම් පිළිවෙත් වල වෙනස්කිරීම්**

පහත සඳහන් කර ඇති මූල්‍ය ප්‍රකාශන වල වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන කාල සීමාව සඳහා ක්‍රමාණුකූලව සඳහන් කර ඇත.

පවත්නා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා සසඳමින් වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම අදාල තැන්හි සංශෝධනය කර ඇත.

**2.3 විදේශ විනිමය පරිවර්තනය**

**2.3.1 මෙහෙයුම් සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය**

මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇති ගණුදෙනු සහ ශේෂය මනිනු ලබන්නේ ආයතනය මෙහෙය වනු ලබන ප්‍රාථමික ආර්ථික පරිසරය අනුවය. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

**2.3.2 ගණුදෙනු සහ ශේෂය**

විදේශ විනිමය ගණුදෙනු ක්‍රියාකාරකම් විනිමය ගණුදෙනු බවට පරිවර්තනය කරනුයේ ගණුදෙනු කරන දිනයේ පවත්නා විනිමය අනුපාතය මතය.

**2.4 දේපළ පිරියත උපකරන පිරිවැය**

දේපළ පිරියත උපකරන පිරිවැය යනු මිලදී ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීම සඳහා දරන ලද වියදම් වත්කම අපේක්ෂිත කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට දැරූ වියදම වේ .දේපළ පිරියත සහ යන්ත්‍ර උපකරණවල වටිනාකම දක්වන විටදී එය මිලදී ගැනීමට දැරූ මූලික වියදමින් මෙතෙක් ක්ෂයවීම් හා හානි අඩුකිරීමෙන් පසු ශුද්ධ වටිනාකම දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීමේ, වැඩිදියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ වියදම් හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ තත්ත්වයට පත් කිරීම දක්වා ගිණුම් වත්කම් තීරණය ලෙස සළකා ඇත. වත්කම් වලට අදාල නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කිරීම් වියදම් අදාල ආදායම් වියදම් ගිණුමට ලියාහැර ඇත.

ඉඩම් වටිනාකම ක්ෂයකිරීමට ලක් නොවන අතර අනෙකුත් වත්කම් ක්ෂයකිරීමට ලක් කිරීමේදී සරළ රේඛීය ක්ෂය ක්‍රමය යොදාගෙන ඇත. අදාල වත්කම් වල ආයුකාලය පහත පරිදි ගෙන ඇත.

| වත්කම් වර්ගය | අවුරුද්ද |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 05 තුල |
| ලී බඩු සහ සවිකිරීම් | වර්ෂ 10 තුළ |
| කාර්යාල උපකරණ | වර්ෂ 05 තුල |
| විවිධ උපකරණ | වර්ෂ 05 තුල |
| පරිගණක සහ මුද්‍රන යන්ත්‍ර | වර්ෂ 04 තුල |
| යන්ත්‍ර | වර්ෂ 05 තුල |
| ගොඩනැගිලි | වර්ෂ 20 තුල |
| විද්‍යුත් උපකරණ (LED) | වර්ෂ 03 තුල |

වත්කම් වල පොත් අගය එහි ඇස්තමේන්තුගත උපයා ගතහැකි අගයට වඩා වැඩි අගයක් ගන්නේ නම් එම වත්කම් වල පොත් අගය වහාම උපයාගත හැකි අගයට ලියාහරිනු ලැබේ.

**2.4.1 භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් මත කරන ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් සහ කාලීන තැන්පතු පිරිවැය අනුව සඳහන් කර ඇත.

**2.6 ලැබීම්**

ලැබීම් යනු ලබාගන්නා ලද සේවාවන් සඳහා ගෙවීමට ඇති මුදල් වේ. එකතුව සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී බලාපොරොත්තු වන අතර ලැබීම් වර්ගීකරණය කරනුයේ ජංගම වත්කම් ලෙසය. ලැබීම් හඳුනාගැනීම සහ මනිනු ලබන්නේ ගණුදෙනු කරන කරන වටිනාකම /අගය මතය.

**2.7 මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් හඳුන්වා ඇත්තේ අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු , බැංකුවල ඇති ක්ෂණික /ස්ථාවර තැන්පතු සහ පාරිතෝෂික අරමුදල්ය

**2.8 ගෙවීම්**

ගෙවීම් යනු භාණ්ඩ හා සේවා සපයන්නන් ලබාගත් භාණ්ඩ හා සේවා සඳහා අවශ්‍යයෙන් කළයුතු ගෙවීම් වේ. ගෙවීම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් කාලචක්‍රයේ කළ යුතු ගෙවීමක් නම් එය ජංගම වත්කමක් ලෙස වර්ග කරනු ලැබේ. (වසර 1 ක් හෝ ඊට අඩු) එසේ නොමැති අවස්ථාවල ඒවා ජංගම නොවන වත්කම් ලෙස හඳුන්වනු ලැබේ.
ගෙවීම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ ගණුදෙනු කරන මිලට අනුව වන අතර ඉන් පසුව ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී මෙම මිලට මිණුම් කරනු ලැබේ.

**2.9 රජයේ ප්‍රතිපාදන**

මූල්‍ය නොවන ප්‍රතිපාදන ඇතුලත්ව රජයෙන් ලැබෙන ප්‍රතිපාදන ඒවායෙහි සාධාරන වටිනාකම අනුව හඳුනාගනු ලැබේ.

දේපළ පිරියත සහ උපකරණ වලට අදාල රජයේ ප්‍රතිපාදන ජංගම නොවන වත්කම් වල රජයේ විලම්භිත ප්‍රතිපාදන යටතට ඇතුලත් කර ඇති අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී මෙය හඳුනාගනු ලබන්නේ අදාල වත්කම් වල අපේක්ෂිත ආයු කාලයේ සරළ රේඛීය පදනම මතය.

මූල්‍ය නොවන ප්‍රතිපාදන මූල්‍ය නොවන වත්කමෙහි ධාරණ වටිනාකම අනුව ගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකම අනුව ප්‍රතිපාදන ලබාදීම සහ වත්කම් ගණනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......

**2.10 මිලදී ගැනීමේ පිරිවැය**

මුදල් කාර්යඵලය පිළිබද ප්‍රකාශයේ මිලදී ගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ මිලදී ගන්නා ලද කාලය තුලය.

**2.11 සේවක ප්‍රතිලාභ**

කොමිෂන් සභාවට නිශ්චිත ප්‍රතිලාභ සහ නිශ්චිත දායකත්වය පිළිබද සැළසුම් ඇත

**(a) නිශ්චිත දායකත්ව සැලැස්ම**

නිශ්චිත දායකත්ව සැළැස්මක් යනු කොමිෂන් සභාව මගින් ස්ථාවර දායකත්ව මුදලක් වෙනම අස්ථිත්වයක් වෙත ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි. මෙය පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මක් බැවින් තවදුරටත් ඒ සඳහා දායකත්ව මුදලක් ගෙවීම සඳහා කොමිෂන් සභාවට භෞතික හෝ අධ්‍යාත්මික බැදීමක් නොමැත. කල් පිරුණු පසු මෙම දායකත්ව මුදල් සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන් හඳුන්වනු ලැබේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් එක් සේවකයෙකුගෙන් දළ පාරිශ්‍රමික මුදලක් ලෙස 15% ක් බැර කරනු ලබන අතර සේවා නියුක්ති භාරකාර අරමුදලට 3% දළ පාරිශ්‍රමිකයක් අය කරනු ලැබේ.

**(b) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම**

සේවකයාගේ සේවා පළමු වර්ෂයේ සිට සේවය කරනු ලබන සෑම වර්ෂයකම මාස ½ ක වේතනය සේවක පාරිතෝෂික අරමුදලට බැර කිරීමට කටයුතු යොදා ඇත. කෙසේ වෙතත් 1983 පාරිතොෂික අරමුදල ගෙවීමේ පනත් අංක 12 අනුව සේවකයෙකුට පාරිතෝෂික අරමුදලට හිමිකම් ලබාගත හැක්කේ වර්ෂ 05 අඛණ්ඩ සේවාවක් කිරීමෙනි.

**(c) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ**

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ පිළිබද වගකීම මනිනු ලබන්නේ සේවකයින් විසින් ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත වට්ටම් හෝ කරන ලද මුදලමය වටිනාකම මතය

**2.12 ප්‍රතිපාදන සහ අවිනිශ්චිත වගකීම්**

මෙහෙයුම් වියදම් සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලබන්නේ අතීතයේ සිදුකරන ලද සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් කොමිෂන් සභාවට වර්තමානයේ ඇති නෛතික බැදීම හෝ කොමිෂන් සභාවට අවශ්‍ය ආර්ථික සම්පත් පිටතට ගලායෑම සිදුවිය හැකි අතර විශ්වසනීය ලෙස එම ප්‍රමාණයන් ඇස්තමේන්තු ගත කල හැකිය.

පදනම් කරගෙන දැනට පවත්නා බැදීමද වගකීම පියවීම / නිරවුල් කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම අනුව ප්‍රතිපාදන මනිනු ලැබේ.

සියලුම අස්ථාවර වගකීම් මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහනක් ලෙස එළිදරවු නොකළහොත් සම්පත් පිටතට ගලායාමේ හැකියාව දුරස්ථ වනු ඇත.

**2.13 ආදායම හඳුනාගැනීම**

ආර්ථික ප්‍රතිලාභ සත්‍ය වශයෙන්ම ආයතනයට ගලා එන අවස්ථාවේදී ආදායම් වශයෙන් හඳුනාගැනීම. කොමිෂන් සභාව අදායම හඳුනාගනු ලබන්නේ ආදායම් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම මැනිය හැකි අවස්ථාව සහ ඉදිරියේදී කොමිෂන් සභාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි සම්භාවිතාව අනුවය.

කොමිෂන් සභාව විසින් ආදායම හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන නිර්ණායක හඳුනාගත හැක. ඒ ඒ ප්‍රධාන මාර්ග වල ආදායම මැනීම සඳහා ආදේශ කර ඇත.

**(a) බලපත්‍ර ආදායම**

මාර්ග බලපත්‍ර වලින් ලැබෙන අදායම හඳුනාගනු ලබන්නේ කොමිෂන් සභාව වෙත අනාගතයේ ආර්ථික ප්‍රතිලාභ සැලැස්මට ඇති හැකියාව මතය.

**(b) දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමේදි ඇති ලාභ සහ අලාභ**

බැහැර කිරීමේදී ඇති ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ලත් මුදල් / උත්පාදන මුදල් ධාරන පිරිවැයත් සමඟ සන්සන්දනය කිරීමෙනි. මෙය මුදල් කාර්යඵල ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

**2.14 වියදම්**

මෙහෙයුම් කරන කාලසීමාවේදී දරන ලද වියදම් යනු වාර්තාකරන කාලයේදී ලාභය ලෙස ලැබෙන ආදායමයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2.15** **ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සිදුවීම්**

ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවන ද්‍රව්‍යමය සිදුවීම් සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය තැන්වල සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

**2.16** **වගකීම්**

ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සියලුම ද්‍රව්‍යමය වගකීම් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් කිරීම මඟින් අනාවරණය කර ඇත.

**3.** **වැදගත් ගිණුම්කරණ පිළිවෙත් (නිමාන) සහ විනිශ්චයන්**

මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වය මඟින් විනිශ්චයන් ගණනාවක් යොදාගනු ලබන අතර වත්කම්, වගකීම්, ආදායම සහ වියදම හඳුනාගැනීම සහ මැනීම සඳහා තක්සේරු (නිමාන) සහ උපකල්පන රාශියක් උපයෝගී කරගනු ලබයි. මැනීමට යන හඳුනාගැනිම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරන තක්සේරු /පළාත් සහ උපකල්පන පිළිබඳ තොරතුරු පහත දක්වා ඇති පරිදි වේ:

(a) **ක්ෂය වීගෙන යන වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය**
වත්කමේ අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත ශේෂ පත්‍ර දිනයට ක්ෂය වන වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තක්සේරු කරනු ලබන බව කළමණාකාරීත්වය සමාලෝචනයෙහි දක්වා ඇත. මෙම අස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයන්ට හේතුව ඇතැම් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණික උපාංග වල උපයෝගීතාවය වෙනස් කිරීමට ඉවහල් වන යල්පැන ගිය තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමය.

4 දේපළ පිරියත සහ උපකරණ

සින්නක්කර වත්කම් - පිරිවැය

| අංක | වත්කම් පංතිය | පිරිවැය | | | | ක්ෂය | ක්ෂය කිරීම | | | | ශේෂය | ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2021.01.01 දිනට ශේෂය | අපහරනය කිරීම් | වසර තුළදී එකතුකිරීම් | 2021.12.31 දිනට ශේෂය | ප්‍රතිශතය | 2021.01.01 දිනට ශේෂය | අපහරනය කිරීම් | වසර තුළදී එකතුකිරීම් | 2021.12.31 දිනට ශේෂය | 2021 | 2020 |
| 1 | ඉඩම් | 245,000,000.00 | | - | 245,000,000.00 | - | - | | - | - | 245,000,000.00 | 245,000,000.00 |
| 2 | ගොඩනැගිලි | 195,683,739.57 | | - | 195,683,739.57 | 5% | 79,497,456.69 | | 8,969,967.98 | 88,467,424.67 | 107,216,314.90 | 116,186,282.88 |
| 3 | මෝටර් වාහන | 75,547,270.00 | | - | 75,547,270.00 | 20% | 69,129,249.10 | | 348,657.53 | 69,477,906.63 | 6,069,363.37 | 6,418,020.90 |
| 4 | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 35,526,054.77 | 496,031.66 | 116,208.00 | 35,146,231.11 | 10% | 26,063,024.28 | 465,730.85 | 1,883,190.54 | 27,480,483.97 | 7,665,747.14 | 9,463,030.49 |
| 5 | කාර්යාල උපකරණ | 25,385,951.13 | 664,167.50 | 7,500.00 | 24,729,283.63 | 20% | 16,839,606.98 | 664,167.50 | 2,982,370.34 | 19,157,809.82 | 5,571,473.81 | 8,546,344.15 |
| 6 | විවිධ උපකරණ | 9,173,844.55 | | 65,800.00 | 9,239,644.55 | 20% | 5,645,939.41 | | 967,080.07 | 6,613,019.48 | 2,626,625.07 | 3,527,905.14 |
| 7 | පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර | 67,949,075.72 | 2,497,735.80 | 612,781.20 | 66,064,121.12 | 25% | 52,191,802.99 | 2,497,735.80 | 5,234,641.58 | 54,928,708.77 | 11,135,412.35 | 15,757,272.73 |
| 8 | යන්ත්‍රෝපකරණ | 1,775,637.00 | | - | 1,775,637.00 | 20% | 1,775,637.00 | | - | 1,775,637.00 | - | - |
| 9 | විද්‍යුත් ප්‍රදර්ශන නාමපුවරු | 62,415,360.00 | | - | 62,415,360.00 | 33.33% | 62,415,360.00 | | - | 62,415,360.00 | - | - |
| Total | | 718,456,932.74 | 3,657,934.96 | 802,289.20 | 715,601,286.98 | | 313,558,076.45 | 3,627,634.15 | 20,385,908.05 | 330,316,350.34 | 385,284,936.64 | 404,898,856.29 |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| 12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | | 2021 | 2020 |
|---|---|---|---|
| **5 ලැබියයුතු, තැන්පතු සහ අත්තිකාරම්** | | | |
| ලැබියයුතු | සටහන 5.1 | 8,939,297.78 | 5,045,984.27 |
| තැන්පතු සහ අත්තිකාරම් | සටහන 5.2 | 3,020,203.12 | 2,123,160.33 |
| | | **11,959,500.90** | **7,169,144.60** |
| **5.1 ලැබියයුතු** | | | |
| ලැබිය යුතු ආදායම් | | 8,810,164.00 | 4,846,696.27 |
| මැතිවරණ දෙපාර්තමෙන්තුව | | 152,607.50 | 152,607.50 |
| වෙනත් ලැබිය යුතු | | 129,133.78 | 46,680.50 |
| | | **9,091,905.28** | **5,045,984.27** |
| **5.2 තැන්පතු සහ අත්තිකාරම්** | | | |
| තැන්පතු | | 686,500.00 | 686,500.00 |
| අත්තිකාරම් - ව්‍යාපෘති | | 25,000.00 | - |
| අත්තිකාරම් - ජාගකොස | | 101,602.52 | 61,380.00 |
| අත්තිකාරම් ගෙවීම් | | 2,207,100.60 | 1,375,280.33 |
| | | **3,020,203.12** | **2,123,160.33** |
| **6 ලැබියයුතු - සේවක** | | | |
| ආපදා ණය | | 27,338,315.00 | 25,874,140.00 |
| රෙදිපිළි සඳහා අත්තිකාරම් | | 330,200.00 | 20,200.00 |
| උත්සව අත්තිකාරම් | | 138,000.00 | 8,000.00 |
| | | **27,806,515.00** | **25,902,340.00** |
| **7 ආයෝජන - කාලීන තැන්පතු** | | | |
| කාලීනතැන්පතු | | 44,842,369.40 | 42,053,092.41 |
| | | **44,842,369.40** | **42,053,092.41** |

පාරිතෝෂික වගකීම සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.43,922,369.40 (2020-41,133,092.41)

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **8 ආයෝජන - භාණ්ඩාගාර බිල්පත්** | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | 15,645,319.00 | 14,935,680.00 |
| | | **15,645,319.00** | **14,935,680.00** |

පාරිතෝෂික වගකීම සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.15,645,319.00 (2020-14,935,680.00)

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **9 මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| මුදල් -අතැති | සටහන 9.1 | 684,693.48 | 155,820.00 |
| මුදල් - බැංකු | සටහන 9.2 | 2,894,852.88 | 796,473.34 |
| කෙටිකාලීන තැන්පතු | සටහන 9.3 | 379,238,858.40 | 516,310,421.87 |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් හා මුදල් සමාන දෑ** | | **382,818,404.76** | **517,262,715.21** |
| **9.1 මුදල්- අතැති** | | | |
| අතැති මුදල් | | 609,693.48 | 80,820.00 |
| සුළු මුදල් අග්‍රිමය | | 75,000.00 | 75,000.00 |
| | | **684,693.48** | **155,820.00** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

## 12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | 2021 | 2020 |
|---|---|---|
| **9.2 මුදල් - බැංකු** | | |
| මහජන බැංකුව -නාරාහේන්පිට | 2,797,382.50 | 744,847.27 |
| මහජන බැංකුව -නාරාහේන්පිට( ආසන වෙන් කිරීම්) | 97,470.38 | 51,626.07 |
| | **2,894,852.88** | **796,473.34** |

| | 2021 | 2020 |
|---|---|---|
| **9.3 කෙටි කාලීන තැන්පතු** | | |
| කෙටිකාලීන ආයෝජන සහ කැඳවුම් තැන්පතු | 68,800,941.09 | 65,668,245.22 |
| ආයෝජන- රෙපෝ | 310,000,000.00 | 450,261,379.54 |
| ඉතිරිකිරීමේ ගිණුම - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 437,917.31 | 380,797.11 |
| | **379,238,858.40** | **516,310,421.87** |

පාර්තෝෂික වගකීම සඳහා වෙනම පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පතු මුදල රු.380,797.11 (2019-314,759.84) .

| | 2021 | 2020 |
|---|---|---|
| **10 රජයේ ප්‍රදාන** | | |
| **ජනවාරි 01දිනට ශේෂය** | **243,505,851.02** | **267,821,299.86** |
| වසර තුළ ප්‍රදාන ලැබීම් | - | - |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | (22,167,003.87) | (24,315,448.84) |
| **දෙසැම්බර් 31ට ශේෂය** | **221,338,847.15** | **243,505,851.02** |

අංක.241 උද්‍යාගන පාර, නාරාහේන්පිට පිහිටි ඉඩම ශ්‍රී ලංකා රජයෙන් ලද මූල්‍ය නොවන රජයේ ප්‍රදානයක් ලෙස හඳුනාගෙන ප්‍රදානය ලද අවස්ථාවේ වෙළඳපොල අගයට වත්කම් සටහන් කරගන්නා ලද අතර ගොඩනැගිලිවල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමක්ෂය කරන ලදී.

| | 2021 | 2020 |
|---|---|---|
| **11 ගෙවියයුතු විශ්‍රාමික ප්‍රතිලාභ** | | |
| **ජනවාරි 01 දිනට ශේෂය** | 53,127,501.50 | 45,668,232.50 |
| වසර තුළ හඳුනාගත් වියදම් | 5,248,909.50 | 9,156,909.00 |
| වසර තුළ කරන ලද ගෙවීම් | -2,470,872.50 | -1,697,640.00 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **55,905,538.50** | **53,127,501.50** |

| | 2021 | 2020 |
|---|---|---|
| **12 ගෙවිය යුතු** | | |
| කුලියට ගැනීම් | 47,071.79 | 47,071.79 |
| වෘත්තීය සමිති සඳහා දායකත්වය | 8,200.00 | - |
| මුද්දර ගාස්තු | 14,100.00 | 28,375.00 |
| රක්ෂණ | - | 379.00 |
| උපයන විට ගෙවීමේ බදු | 418.00 | 27,418.00 |
| විවිධ ණයහිමියෝ | - | 62,405.00 |
| වෙනත් ගෙවියයුතු | 561,460.19 | 851,944.27 |
| EPF ගෙවිය යුතු | 67,246.75 | 61,702.50 |
| ETF ගෙවිය යුතු | 8,069.61 | 7,404.30 |
| බැංකු ණය සහ තැන්පතු | - | 10,729.00 |
| ආසන වෙන් කිරීම සඳහා ගෙවියයුතු | 103,711.36 | 11,266.07 |
| BIA ගේට්වේ ව්‍යාපෘතිය | 761,790.00 | 761,790.00 |
| | **1,572,067.70** | **1,870,484.93** |

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **13 වෙන් කිරීම් සහ උපචිත වියදම්** | | | |
| උපචිත වියදම් - ව්‍යාපෘති | **සටහන 13.1** | 71,445,218.70 | 89,678,696.58 |
| උපචිත වියදම් - පුනරාවර්තන | **සටහන 13.2** | 18,188,891.14 | 17,706,736.04 |
| විගණන ගාස්තු වෙන් කිරීම් | | 1,976,026.00 | 1,476,026.00 |
| | | **91,610,135.84** | **108,861,458.62** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| 12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 2021 | 2020 |
|---|---|---|
| **13.1 උපචිත වියදම් - ව්‍යාපෘති** | | |
| පුනරාවර්තන | | |
| සමාජයීය සුභසාධන බස් සේවා සඳහා දායකත්වය | 69,892,536.00 | 87,026,249.19 |
| පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ | 735,752.70 | 237,999.96 |
| ගුණාත්මය හා ගාස්තු නියාමනය | 816,930.00 | 1,581,009.92 |
| ප්‍රවාහනය ආශ්‍රිත පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | - | 77,470.00 |
| ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛණ වාර්තාව | | |
| | **71,445,218.70** | **88,922,729.07** |
| ප්‍රාග්ධන | | |
| පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ | - | 755,967.51 |
| | - | **755,967.51** |
| | **71,445,218.70** | **89,678,696.58** |
| **13.2 උපචිත වියදම් - පුනරාවර්තන** | | |
| ප්‍රසාද දීමනා | 30,000.00 | |
| පිරිසිදු කිරීමේ සේවා | 869,283.58 | 702,534.78 |
| සන්නිවේදන | 176,104.98 | 354,392.45 |
| විදුලිය සහ බලය | 661,824.20 | 582,381.65 |
| සේවක සුභසාධන | 4,779,050.00 | 2,984,425.14 |
| සේවක වෛද්‍යාධාර ක්‍රමය | 5,000.00 | 5,000.00 |
| ඉන්ධන සහ ලිහිසි | 196,247.21 | 330,075.58 |
| නිවාඩු දින දීමනා -විධායක | 35,955.50 | - |
| භාෂා දීමනා | - | 260.00 |
| නීති ගාස්තු | - | 223,600.00 |
| ගමන් වියදම් - දේශීය | 68,688.00 | 63,962.50 |
| මෝටර් රථ අළුත්වැඩියාව | - | 334,118.39 |
| කාර්යාල උපකරණ නඩත්තු | 117,261.00 | 35,429.00 |
| වෘත්තීය ආයතන සාමාජික ගාස්තු | 4,000.00 | 21,000.00 |
| රැස්වීම් සඳහා ආහාරපාන | 3,040.00 | 8,615.00 |
| පුවත්පත් සහ සඟරා | 14,092.00 | 57,040.00 |
| කාර්යාලයීය අවශ්‍යතා | 15,880.00 | 395,580.00 |
| විවිධ වියදම් | 240,904.40 | 84,449.00 |
| අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන | 963,161.00 | 913,034.00 |
| පුවත්පත් දැන්වීම් | - | 19,440.00 |
| මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තුව | 278,124.79 | |
| වැටුප් හා වේතන | 241,888.30 | 221,954.00 |
| ආරක්ෂක සේවා | 1,419,277.05 | 2,220,904.17 |
| කාර්ය මණ්ඩල පුහුණු | 48,031.74 | 45,336.74 |
| ප්‍රවාහන සහ කුලී ගාස්තු | 133,920.00 | 187,539.00 |
| ජලය | 45,089.49 | 36,120.10 |
| ලදුපත් මත මුද්දර ගාස්තු | 4,100.00 | 2,825.00 |
| ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 7,837,967.90 | 7,876,719.54 |
| | **18,188,891.14** | **17,706,736.04** |

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ.

| 12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | | 2021 | 2020 |
|---|---|---|---|
| **14** | **ආදායම** | | |
| | **14.1 බලපත්‍ර ආදායම්** | | |
| | මාර්ග බලපත්‍ර ආදායම | 1,500.00 | 30,000.00 |
| | බලපත්‍ර අළුත්කිරීමේ ආදායම | 11,555,148.00 | 10,987,836.00 |
| | මාර්ග ටෙන්ඩර් ආදායම | 27,180,283.05 | 131,819,474.05 |
| | | **38,736,931.05** | **142,837,310.05** |
| | **14.2 වෙනත් ආදායම්** | | |
| | පරිපාලන ආදායම් | 27,763,304.00 | 14,666,500.00 |
| | බැස්ටියන් මාවත වැසිකිලි ආදායම | 6,610,411.50 | 7,130,532.52 |
| | විවිධ ආදායම් | 14,736,656.19 | 25,575,000.13 |
| | | **49,110,371.69** | **47,372,032.65** |
| | **මුළු ආදායම** | **87,847,302.74** | **190,209,342.70** |
| **15** | **වෙනත් ආදායම්** | | |
| | **15.1 පොළී ආදායම** | | |
| | තැන්පතු මත පොළිය | 22,536,193.14 | 33,943,089.70 |
| | ආපදාණය පොළිය | 1,079,028.00 | 900,032.00 |
| | | **23,615,221.14** | **34,843,121.70** |
| | **15.2 වෙනත්** | | |
| | රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය | 22,167,003.87 | 24,315,448.84 |
| | | **22,167,003.87** | **24,315,448.84** |
| | | **45,782,225.01** | **59,158,570.54** |
| **16** | **මෙහෙයුම් වියදම්** | | |
| | **16.1 සේවක මණ්ඩල වියදම්** | | |
| | වැටුප් හා වේතන | 87,606,250.43 | 87,241,658.40 |
| | ජීවන වියදම් දීමනාව | 16,809,095.09 | 17,079,388.00 |
| | වෘතීය දීමනා | 711,677.00 | 665,613.00 |
| | භාෂා දීමනාව | 318,925.00 | 281,149.00 |
| | සේවක අර්ථසාධක අරමුදල් | 15,635,389.01 | 15,768,117.66 |
| | සේවක භාරකාර අරමුදල | 3,127,077.80 | 3,153,623.53 |
| | නිවාඩු දින දීමනා -විධායක | 277,973.50 | 707,293.00 |
| | අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන | 7,202,291.00 | 10,207,697.00 |
| | පාවිච්චියට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 8,005,192.90 | 8,030,919.54 |
| | පාරිතෝෂික | 5,248,909.50 | 9,156,909.00 |
| | ප්‍රසාද දීමනා | 2,694,000.00 | 2,688,750.00 |
| | | **147,636,781.23** | **154,981,118.13** |
| | **16.2 ප්‍රවාහන** | | |
| | මෝටර්රථ අළුත්වැඩියා සහ නඩත්තු | 4,254,617.44 | 3,982,200.81 |
| | ඉන්ධන සහ ලිහිසි | 3,564,886.89 | 3,565,232.74 |
| | ප්‍රවාහන සහ කුලී ගාස්තු | 3,346,465.78 | 4,254,930.65 |
| | බලපත්‍ර සහ රක්ෂණ | 983,711.44 | 1,067,837.88 |
| | | **12,149,681.55** | **12,870,202.08** |
| | **16.3 ගමන් වියදම් හා යැපීම් දීමනා** | | |
| | දේශීය ගමන් වියදම් | 945,725.50 | 1,481,487.25 |
| | | **945,725.50** | **1,481,487.25** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| 12.31 දිනෙන් අවසන් වර්ෂයේමූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 2020 | 2020 |
|---|---|---|
| **16.4 ආයතන වියදම්** | | |
| කාර්යාලයීය අවශ්‍යතා (ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ) | 3,167,765.92 | 2,730,152.81 |
| පිරිසිදු කිරීම් | 6,013,153.32 | 8,973,639.44 |
| වරිපනම් හා බදු | 374,220.00 | 374,220.00 |
| ආරක්ෂක සේවා | 13,039,661.74 | 14,641,266.94 |
| විදුලිය සහ බලය | 6,575,994.55 | 7,514,665.70 |
| ජලය | 482,876.62 | 452,260.40 |
| අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | 1,112,200.00 | 853,400.00 |
| රැස්වීම් සඳහා ආහාරපාන | 251,062.10 | 222,800.86 |
| මාර්ගස්ථ මුදල් රක්ෂණය | 31,284.41 | 44,166.77 |
| සන්නිවේදන | 3,564,601.94 | 3,372,490.10 |
| | **34,612,820.60** | **39,179,063.02** |
| **16.5 ස්ථාවර වත්කම් අළුත්වැඩියා සහ නඩත්තු** | | |
| ගොඩනැගිලි අළුත්වැඩියාව | 341,783.00 | 363,426.50 |
| කාර්යාලයීය උපකරණ අළුත්වැඩියාව | 1,504,087.38 | 1,955,254.94 |
| පරිගණක සහ උපාංග අළුත්වැඩියාව | 88,030.69 | 58,495.93 |
| | **1,933,901.07** | **2,377,177.37** |
| **16.6 සේවක සුභසාධනය** | | |
| සේවක වෛද්‍යාධාර ක්‍රමය | 119,687.50 | 333,000.00 |
| සේවක සුභසාධනය | 6,666,918.01 | 6,473,440.98 |
| නිල ඇඳුම් | - | 9,530.00 |
| | **6,786,605.51** | **6,815,970.98** |
| **16.7 සේවක සංවර්ධනය** | | |
| සේවක පුහුණු කිරීම් | 145,000.00 | 432,190.00 |
| වෘත්තිය ආයතන සාමාජික ගාස්තු | 71,610.00 | 200,428.72 |
| | **216,610.00** | **632,618.72** |
| **16.8 නීති ගාස්තු සහ වෙනත්** | | |
| විගණන ගාස්තු | 500,000.00 | 650,000.00 |
| නීති ගාස්තු | 740,819.00 | 678,549.00 |
| | **1,240,819.00** | **1,328,549.00** |
| **16.9 තොරතුරු** | | |
| පුවත්පත් දැන්වීම් | 539,375.55 | 661,969.00 |
| පුවත්පත් සහ සඟරා | 32,770.00 | 97,310.00 |
| | **572,145.55** | **759,279.00** |
| **16.10 ක්ෂය** | | |
| ගොඩනැගිලි | 8,969,967.98 | 9,487,724.65 |
| මෝටර් වාහන | 348,657.53 | 420,000.00 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 1,883,190.54 | 2,929,842.60 |
| කාර්යාලයීය උපකරණ | 2,982,370.34 | 2,980,320.03 |
| විවිධ උපකරණ | 967,080.07 | 1,052,040.99 |
| පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර | 5,234,641.58 | 10,224,841.97 |
| | 20,385,908.04 | 27,094,770.24 |
| **16.11 මූල්‍ය ගාස්තු** | | |
| බැංකු ගාස්තු | 44,171.20 | 39,174.18 |
| | **44,171.20** | **39,174.18** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| 12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | | 2020 | 2020 |
|---|---|---|---|
| | **16.12 වෙනත් වියදම්** | | |
| | විවිධ වියදම් | 822,760.14 | 1,681,689.90 |
| | ලදුපත් සඳහා මුද්දර ගාස්තු | 7,125.00 | 17,500.00 |
| | | **829,885.14** | **1,699,189.90** |
| **17** | **මෙහෙයුම් නොවන ආදායම්** | | |
| | අපහරණය කළ වත්කම් | 13,749.19 | 15,430.00 |
| | | **13,749.19** | **15,430.00** |
| **18** | **ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන** | | |
| | ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන- පුනරාවර්තන | 271,000,000.00 | 401,999,970.00 |
| | | **271,000,000.00** | **401,999,970.00** |
| **19** | **19.1 රජයේ ප්‍රදාන මත විශේෂ ව්‍යාපෘති වියදම්** | | |
| | ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන | | |
| | සමාජයීය සුභසාධනය සඳහා බස් සේවා සැපයීම | 271,000,000.00 | 401,999,970.00 |
| | | **271,000,000.00** | **401,999,970.00** |
| | **19.2 ජංගමකොස අරමුදල් මත විශේෂ ව්‍යාපෘති වියදම්** | | |
| | ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන | | |
| | පුද්ගලික බස් කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ | 2,756,934.25 | 7,224,248.11 |
| | ප්‍රවාහනයේ ගුණත්වය වැඩි දියුණු කිරීම හා බස් ගාස්තු නියාමනය | 8,818,754.37 | 12,899,256.89 |
| | සේවක පුහුණුව හා සංවර්ධනය | | 14,600.00 |
| | ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කිරීම | 83,886.00 | 113,060.00 |
| | ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීම | 230,839.00 | 375,090.00 |
| | | 11,890,413.62 | 20,626,255.00 |
| | ව්‍යාපෘති වියදම් -ප්‍රාග්ධන | | |
| | පුද්ගලික බස් කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ බස් පර්යන්ත සංවර්ධනය | 519,249.32 | 3,194,556.35 |
| | ප්‍රවාහනයේ ගුණත්වය වැඩි දියුණු කිරීම් | 7,520.00 | 151,753.15 |
| | ආයතනික ප්‍රතිසංස්කරණ සහ යටිතලපහසුකම් සංවර්ධනය | 166,695.00 | 895,528.43 |
| | | 693,464.32 | 4,241,837.93 |
| | | **12,583,877.94** | **24,868,092.93** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 9 (ඏ) වගන්තියට අනුව කොමිෂන් සභාවට වෙත මගී සේවා අවසරපත්‍ර දරන්නන් විසින් බස් රථ සේවා සැලසීමට අදාළ ස්වකීය කටයුතු නිසි පරිදී ඉටු කල හැකිවනු පිනිස ඒ අවසර පත්‍ර දරන්නන්ට ඉංජිනේරු, තාක්ෂණික, නීතිමය, වෛද්‍ය සහ මූල්‍ය ආධාර සහ උපදෙස් ලබාදීමට බලතල පවතී.

මෙම විධිවිධාන මත පදනම්ව, අතිගරු ජනාධිපතිතුමාගේ මගපෙන්වීම සහ ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ සහ ප්‍රවාහන අමාත්‍යංශ ලේකම්තුමන්ගේ උපදෙස් මත, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අඩපන වූ ප්‍රවාහන ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් කිරීම සඳහා මහජන බැංකුව සහ ලංකා බැංකුව වෙතින් මගී සේවා අවසරපත්‍ර හිමිකරුවන් වෙත රුපියල් ලක්ෂ 3 ක ණය මුදලක් ලබා දීම සඳහා පහසුකම් සලසන්නකු ලෙසින් කටයුතු කරන ලදී.

ඉහත සඳහන් කරන ලද බැංකු සමඟ ඇති කරගන්නා ලද ලද අවබෝධතා ගිවිසුම් හී මගී සේවා අවසරපත්‍ර හිමිකරුවන් වෙත ලබා දෙන ලද ණය මුදල නැවත අයකරගැනීමේ ක්‍රමවේදය දක්වා ඇති අතර එම ක්‍රමවේදය අනුව මගී සේවා අවසරපත්‍ර හිමිකරු විසින් ණය වාරික නිසි පරිදී නොගෙවන්නේ නම්, ණය මුදල ලබා ගැනීම සඳහා ඇපකරයක් ලෙස තබා ඇති අදාළ මගී සේවා අවසරපත්‍රය අවලංගු කොට එය තෙවන පාර්ශවයක් වෙත නිකුත් කිරීමෙන් ලබන්නාවූ මුදලින් පැහැර හරින ලද ණය පියවීම සඳහා පහසුකම් සැලසීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

කරුණු එසේ වන හෙයින් මගී සේවා අවසරපත්‍ර හිමිකරු විසින් ණය වාරික ගෙවීම පැහැර හැරිම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වගකීමක් නොවේ.

**2020.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

ශ්‍රී ලංකා රාජ්‍ය ගිනුම්කරණ ප්‍රමිත අංක 3 අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු හා වැරදීම් සඳහා කරන ලද ගැලපීම් පහත පරිදි වේ.

01) රු.139,058.05 ක් වූ ඌණ ක්ෂය වෙන් කිරීම සඳහා ගැලපීම් කිරීම.

02)ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් සේවක නිදහස් ප්‍රවේශ පත්‍ර ගාස්තු වෙනුවෙන් ලද රු.270,629.56 ක් වූ වට්ටම් මුදල් ගිණුම්ගත කිරීම.

03) 2020 වර්ෂයට අදාලව වැඩිපුර සිදු කරන ලද සේවක පාරිතෝෂික වෙන් කිරීම් රු.5,948.50 ක් ගිණුම් වලින් ඉවත් කිරීම.

04) හඳුනාගන්නා ලද මැතිවරණ රාජකාරි සඳහා ගෙවන ලද ප්‍රතිපූර්ණය කර ගත යුතු ගමන් වියදම් හා අතිකාල ගෙවීම් ගිණුම්ගත කිරීම.

05) කොවිඩ් -19 වසංගතය හේතුවෙන් පිළිවෙලින් බැස්ටියන් මාවත වැසිකිලි ආදායම හා වව්නියා පර්යන්ත ආදායම් මත ලබා දෙන ලද සහන රු.2,459,688.50 හා රු.1,705,210.00 ක් ආදායම් ගිණුම් වලින් ඉවත් කිරීම.

06) විද්‍යුත් ප්‍රදර්ශණ පුවරු සඳහා ගෙවන ලද නමුත් නැවත අය කර ගත යුතු විදුලි බිල් පත් ගාස්තු ගිණුම්ගත කිරීම.

2020 මූල්‍ය ප්‍රකාශන වලට අදාලව ඉහත කරන ලද ගැලපීම් මත 2020 වර්ෂයේ ඌනතාවය රු.20,894,353.57 සිට රු.24,743,349.56 දක්වා ඉහළ යන ලදී.

මෙම ගැලපීම් වල ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත අතිරික්තය රු.585,840,215.12 සිට රු.581,991,219.13 පහළ යන ලදී.

# විගණකාධිපති වාර්තාව

මගේ අංකය / எனது இல. / My No. සීඔටී/ඒන්ටීසී/එෆ්ඒ/01/2021/144 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 ජුනි 30 දින

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

**ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2021 වර්ෂය තුළ තාවකාලික බස්රථ ධාවනය සඳහා දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ලබාදී තිබුණු අවසරපත් 25 බැගින් වූ පොත් 16 ක් විගණිත දිනය දක්වා ලැබී නොතිබුණු අතර, ඊට අදාළ ලැබිය යුතු ආදායමද ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) බස්රථ හිමියෙකුට රු.300,000 බැගින් බස්රථ හිමියන් 510 කට රාජ්‍ය බැංකු 02 කින් ලබාදුන් රු.153,000,000 ක ණය මුදල් වෙනුවෙන් ආයතනය ඇපවීම නිසා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ආයතනයට එම ප්‍රමාණයෙන් අසම්භාව්‍ය බැරකමක් ඇති වී තිබුණද, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම අසම්භාව්‍ය බැරකම හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ශේෂය ලෙස රු.55,608,904 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එම ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා වන ටෙන්ඩර් ලේඛනය ඇතුළු අනෙකුත් උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කොමිෂන් සභාවේ 2021වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුමට අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතු වේ. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව

හා සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනායාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **විස්තරය** |
|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.9 වගන්තිය | කළමනාකරණ සහකාරිනියක් 2020 ඔක්තෝම්බර් 12 දින සිට 2021 අගෝස්තු 18 දින දක්වා ප්‍රවාහන අමාත්‍යාංශයේ සේවයට මුදාහැර තිබුණි. ඇයට ඉහත කාල පරිච්ඡේදය තුළදී වැටුප් ලෙස රු.584,842 ක්ද, වෛද්‍ය නිවාඩු ප්‍රතිපූර්ණය කිරීම සඳහා රු.104,480 ක්ද ප්‍රසාද දීමනා ලෙස රු.30,000 ක්ද වශයෙන් එකතුව රු.719,322 ක් ඉහත කාල පරිච්ඡේදය තුළ ගෙවා තිබුණි. අමාත්‍යාංශයට නිදහස් කිරීම සහ ආයතනයේ වැටුප් ඇතුලුව දීමනා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අනුමැතිය දැක්වෙන කිසිදු අනුමත ලිපියක් විගණනයට ඉදිරිපත් නොවිණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

Global Poisition System (GPS) පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් 2021 වර්ෂය තුළදී බස් හිමියන්ගෙන් අයකළ මුදලට වඩා රු.3,530,745 ක අමතර වියදමක් දරා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 9 වන වගන්තියේ සඳහන් කොමිෂන් සභා කර්තව්‍යය යටතේ මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීම හා

පනතේ 24 වන වගන්තිය අනුව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයන් හඳුන්වා දී නොතිබුණි. පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීම කළ යුතු වුවද, ඊට පටහැනිව 2015 වසරේ සිට දක්ෂිණ අධිවේගී මාර්ගයේ ධාවනය වන බස්රථ සඳහා නිත්‍ය මගී ධාවන අවසර පත්‍ර නිකුත් කිරීම වෙනුවට තාවකාලික අවසරපත්‍ර පමණක් නිකුත් කර තිබුණු අතර, 2021 වර්ෂය තුළ එම අධිවේගී මාර්ගය වෙනුවෙන් රු.5,178,909 ක වටිනාකමකින් යුත් තාවකාලික අවසර පත්‍ර අවස්ථා 193 කදී නිකුත් කර තිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් නියමිත පරිදි පොදු වශයෙන් භාණ්ඩ ගබඩාවක් පවත්වා ගෙන යනු නොලබන අතර, භාණ්ඩ ලැබීමෙන් පසු භාණ්ඩ ලැබීම් පත්‍රයක (GRN) සටහන් තැබීම සිදු කරනු නොලබන අතර, භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම දිනපතා තුලනය කර ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට බැස්ටියන් මාවත පොදු වැසිකිළි පද්ධතිය වෙනුවෙන් කුලිය ලෙස කුලී ගිවිසුම්ගත සමාගමෙන් රු.7,609,660 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

(ඈ) පිළිවෙළින් පිරිවැය රු.2,952,000, රු.1,730,900 සහ රු.1,000,000 ක් වටිනා වාහන 03 ක් වසර 05 කට වැඩි කාලයක් පරිශ්‍රය තුළ තිබුණු අතර, ඒවා අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 219 ක් වන අතර 2021 දෙසැම්බර් මස 31 දින වන විට තත්‍ය කාර්ය මණ්ඩලය 178 ක් විය. ඉන් 170 ක් ස්ථිර පදනමින් ද 07 ක් කොන්ත්‍රාත් පදනමින් ද සේවය කළ අතර, පුරප්පාඩු 34 ක් පැවතිණි. එම පුරප්පාඩු පිරවීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඊ) 2018 වර්ෂයේ සිට වසර 04 ක කාලය තුළ නිලධාරීන් 07 දෙනෙකු කොන්ත්‍රාත් පදනම යටතේ සේවයට බඳවා ගෙන තිබුණි.

(උ) ආයතනයේ අයවැය ගත ආදායම් තථ්‍ය ආදායම් සමඟ සැසඳීමේදී සියයට 16 ක සිට සියයට 73 ක් දක්වා පරාසයක හා අයවැය ගත වියදම් තථ්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 30 ක සිට සියයට 71 ක් දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඖ) කොමිෂන් සභාවේ 2021 වර්ෂය සඳහා ව්‍යාපෘති 17 ක ප්‍රතිපාදන හා සත්‍ය වියදම් පරීක්ෂාවේදී වෙන්කරන ලද ප්‍රතිපාදන සියයට 100 සිට සියයට 17 දක්වා ඌන උපයෝජනය වී තිබුණි.

(ඕ) කොමිෂන් සභාව විසින් ඉලෙක්ට්‍රොනික් පෙරගෙවුම් කාඩ්පත හඳුන්වාදීම සඳහා රු.මි.8.6 ක් ද, කොමිෂන් සභාවේ කාර්යාල පරිශ්‍රයේ විදුලිබල අවශ්‍යතාවය සඳහා සූර්යකෝෂ සවිකර විදුලිය ජනනය කිරීමේ වැඩසටහනක් වෙනුවෙන් රු.මි.15 ක් ද, සමාලෝචිත වර්ෂයේ වෙන්කර තිබුණද, එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**<u>ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු</u>**

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ)** 2021 වර්ෂය තුලදී දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ලබාදී තිබූ තාවකාලික අවසරපත්‍ර පොත් අතරින් තවදුරටත් පොත් 01ක් ජාතික පමණක් ගමනාගමන කොමිෂන් සභාව වෙත ලැබිය යුතු අතර එය කඩිනමින් ලබා ගැනිමට කටයුතු කරනු ලැබේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලැබී ඇති තාවකාලික අවසරපත්‍ර පොත් වලට අදාල ආදායම ගිණුම්ගත කර ඇත.

**(ආ)** විමසුමේ සඳහන් පරිදි අසම්භව්‍ය බැරකම හෙළිදරව් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2022.06.20 වන දින රජයේ විගණන අංශය වෙත භාර දී ඇත.

**(ඇ)** පරිගණකගත කරන ලද ටෙන්ඩර් තැන්පතු ලේජරයක් ඇති අතර ඊට අමතරව ටෙන්ඩර් අංකය අනුව ටෙන්ඩර් ඉදිරිපත් කල අයවලුන්ගේ නම් හා රිසිට්පත් අංක සහිත විස්තරාත්මක ලේඛණ ගිණුම් අංශය තුල පවත්වාගෙන යනු ලැබේ

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව**

**2.2.2** ප්‍රවාහන අමාත්‍යාංශයෙන් ලද MT/01/05/05/01 අංක දරන 2020.09.07 හා 2020.09.28 දිනැති ලිපි අනුව කේ.එල්. ඉන්දිකා ලක්මාලි මහත්මිය, ප්‍රවාහන අමාත්‍යතුමාගේ සහාය කාර්ය මණ්ඩලයට නිදහස් කල දින සිට නැවත ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත මුදාහැරිය දින තෙක් ( 2020.10.13 දින සිට 2021.08.17 දින දක්වා) ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් ගෙවා ඇති වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස අවස්ථා කිහිපයකදීම ප්‍රවාහන අමාත්‍යාංශය වෙත ලිඛිතව දන්වා ඇත.

**2.2.3** 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 24 වන වගන්තිය අනුව අන්තර් පළාත් මාර්ග සඳහා මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමේ බලතල ජාතික ගමනාගමන කොමිසන් සභාවට පැවරි ඇත. එම වගන්තිය ප්‍රකාරව මගී සේවා අවසරපත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, ඉල්ලුම් පත්‍රයෙහි ඉල්ලා ඇති මාර්ගයේ හෝ මාර්ග වල බස් රථ සේවා සඳහා මහජනතාවගේ ඉල්ලුම් කෙරෙහි සැලකිලිමත්ව කොමිෂන් සභාව විසින් මගීසේවා අවසරපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අවශ්‍ය ප්‍රමාණයට වඩා බස් රථ ප්‍රමාණයක් එම මාර්ගයේ ධාවනය වන්නේ නම් ප්‍රතික්ෂේප කළ හැකිය.

ඒ අනුව මෙම වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව නව මගී සේවා අවසරපත්‍ර විනිවිධ භාවයෙන් නව මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා 2005 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද ක්‍රමවේදයක් අනුව 2008 වර්ෂයේ සිට සාමාන්‍ය මාර්ගයන් හී නව මගී සේවා අවසරපත්‍ර නිකුත්කර ඇත.තවද අධිවේගී මාර්ගයන් හි නව මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද ක්‍රමවේදය මත සිදු කරනු ලබයි.

අමාත්‍ය මණ්ඩල තීරණය මත ටෙන්ඩර් ක්‍රමය මගින් නිත්‍ය මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම් අනුමත කර තිබුනද එම ක්‍රමයේ පවතින ගැටළු හේතුවෙන් නව ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා අමප/19/0409/123/17 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව මගින් ක්‍රමවේදයක් කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත භාරදී තිබිණි.

තවද හිටපු ප්‍රවාහන අමාත්‍යතුමා විසින් නිත්‍ය මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත අංක අමප/21/0351/312/010 දරණ සංදේශය යොමු කරමින් ත්‍රිපුද්ගල කමිටුවක් මගින් සිදුකරනු ලබන ඇගයීම මත නව බලපත්‍ර නිකුත් කිරීමට යෝජනා කෙරෙණි. නමුත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශය මගින් ලබා දී ඇති නිරීක්ෂණ අනුව කටයුතු කරමින් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාවක් ලබා දෙන ලෙසට දන්වා ඇත.

එහිදී මුදල්අමාත්‍යාංශය මගින්ලබාදී ඇති නිරීක්ෂණ මගින් දක්වා ඇත්තේ පෙර කමිටුව මගින් ඉදිරිපත් කර ඇති යෝජනාවේ කරුණුද සැලකිල්ලට ගනිමින් එහි සංකීර්ණ කරුණු පවතීනම් ඒ සඳහා සරල ක්‍රමවේදයක් සකස් කර වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත නැවත ඉදිරිපත් කරන ලෙසය. ඒ අනුව ප්‍රවාහන අමාත්‍යාංශය මගින් එම වාර්තාව සකස් කරමින් පවතී.

එමෙන්ම ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අදාල කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර එම කෙටුම්පත් කරන ලද සංශෝධනයන් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

**2.2.4** ජී.පී.එස්. පද්ධතිය නඩත්තු කිරීමේදී ජී.පී.එස්. උපකරණය තුළින් දත්ත සම්ප්‍රේෂණය කිරීම සඳහා පමණක් අදාල බලපත්‍ර ලාභීන්ගෙන් වාර්ෂිකව රු. 1,500ක මුදලක් අයකරනු ලබයි. එබැවින් පද්ධතිය තුළ ක්‍රියාත්මක පාලන මැදිරිය නඩත්තු හා සේවා කටයුතු සිදුකිරීම, සර්වර් පරිසනක සහ අනෙකුත් තාක්ෂණික උපාංග නඩත්තුව, අන්තර්ජාල සම්බන්ධතා පවත්වාගෙන යාම වැනි සේවා සැපයීම සඳහා වියදම් දැරීමට සිදු වේ. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතියේ අරමුණ ආදායම් ඉපැයීම නොවන අතර පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව වර්ධනය කිරීම උදෙසා ආරක්ෂිත හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීම වේ.

**2.3** වෙනත් කරුණු

(අ) 2014 වර්ෂයේදී මාර්ග සංශෝධන මගින් අධිවේගී මාර්ගයට නිකුත් කරන ලද මගී සේවා අවසරපත්‍ර 2015 වර්ෂයේදී අවලංගු කර එම ධාවකයින්ගේ පැරණි මාර්ගයට අනුයුක්ත කර තිබූ හෙයින් එම බස් රථ අධිවේගී මාර්ගයේ ධාවනය වූ කාලයේදී මගීන් එම සේවාව සඳහා පුරුදුව සිටි බැවින් මගී ඉල්ලුම සපුරාලීමටත් අඛණ්ඩව එම සේවාව පවත්වාගෙන යාමටත් තාවකාලික අවසරපත්‍ර නිකුත් කර ඇත.

තවද තාවකාලික මගී සේවා අවසරපත්‍ර නිකුත්කරනු ලබන මාර්ග සඳහා නිත්‍ය මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමට අවස්ථා 04 කදි ප්‍රසිද්ධ දැන්වීම් මගින් ටෙන්ඩර් කැඳවීමට කටයුතු කලද එයට එරෙහිව ධාවකයින් විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

එමෙන්ම එලෙස තාවකාලික අවසරපත්‍ර නිකුත් කරනු ලබන බලපත්‍රලාභීන් හට නිත්‍ය මගී සේවා අවසරපත්‍ර, මාර්ග හා සේවා සංශෝධන යටතේ නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීඇති අතරම අධිවේගී

මාර්ගයේ මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පවරා ඇති නඩු සමථයකට පත්වීම සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. (අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක- අමප/21/0428/312/014)

ඒ අනුව උක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව නිත්‍ය මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලද බලපත්‍ර 67න් බලපත්‍ර 02 ක් හැර ඉතිරි බලපත්‍ර 65 සඳහා අධිවේගී මාර්ගයේ නිත්‍ය මගීසේවා අවසරපත්‍ර නිකුත් කර ඇත.

(ආ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූලික ලියකියවිලි ආරක්ෂාකාරීව තබාගැනීම සඳහා කුඩා ගබඩාවක් පවත්වාගෙන යනු ලැබේ. මෙම ගබඩාවේ ආයතනයට මිලදී ගනු ලබන වාර්ෂික ලිපිද්‍රව්‍ය (A 4 කොළ, පොත්,පෑන්, කාට්රිජ්, ටෝනර් ආදී ලිපිද්‍රව්‍යයන්), මුද්‍රිත ලියකියවිලි සහ මුද්‍රිත පොත් ආරක්ෂාකාරීව ගබඩා කරනු ලැබේ. මේවා තොග වශයෙන් ලබා ගනු ලබන අතර දෙපාර්තමේන්තු අංශ වෙතින් වරින් වර ලැබෙන ඉල්ලීම් අනුව එම ලිපි ද්‍රව්‍ය නිකුත් කරනු ඇත. එම දෙපාර්තමේන්තු වලට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය නිකුත් කිරීමේදී පොත්වල ක්‍රමානුකූලව සටහන් තබනු ලැබේ. එම සටහන් දෛනිකව තුලනය කරනු ලැබේ.
දෙපාර්තමේන්තු හෝ අංශ මගින් ඇණවුම් කරනු ලබන භාණ්ඩ ප්‍රසම්පාදන අංශය විසින් ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ මිලදී ගැනීමට කටයුතු කරන අතර, මෙසේ මිලදී ගනු ලබන භාණ්ඩ, වත්කම් හෝ ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුලත් කිරීමෙන් පසු අදාල ඉල්ලීම් කරනු ලැබූ දෙපාර්තමේන්තුව හෝ අංශය වෙත භාර දෙනු ලැබේ. එම දෙපාර්තමේන්තුව හෝ අංශය විසින් භාර ගනු ලබන භාණ්ඩ තම දෙපාර්තමේන්තුව/ අංශය මගින් පවත්වාගෙන යනු ලබන ලේඛණයේ එම භාණ්ඩ ලැබීම සටහන් කර ගනු ලැබේ.
කෙසේ වුවද, ඉදිරියේදී, ක්‍රමවත් ගබඩාවක් පවත්වාගැනීමේ අරමුණින් ගබඩා භාරකරු (Store keeper ) නමින් නව තනතුරක් ඇති කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව, විධිමත් ක්‍රමවේදයක් යටතේ වඩා ඉඩපහසුකම් ඇති ස්ථානයක ගබඩාවක් පිහිටුවා විනිවිධභාවයකින් කටයුතු කිරීමට සැළසුම් කරනු ලැබේ.

(ඇ) බැස්ටියන් මාවත පොදු වැසිකිළි පද්ධතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාල හිඟ කුලිය වන රු. 7,609,660.00 ක මුදල ගිවිසුම්ගත සමාගමෙන් ගෙවා ඇත.

(ඈ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ධාවනයට නුසුදුසු තත්වයේ පැවති KB -3305 අංක දරන මෝටර් රථය හා PB-5676 අංක දරන වෑන් රථය අපහරණය කර ඇත. ඒ අනුව KB -3305 අංක දරන මෝටර් රථය රු. 2,683,000.00 ක මුදලකටත්, PB-5676 අංක දරන වෑන් රථය රු. 2,002,002.00 ක මුදලකටත්, ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ වැඩිම මිළගණන් ඉදිරිපත් කර ඇති ලංසුකරුවන් වෙත අලෙවි කර ඇත.
රජය විසින් වාහන ගෙන්වීම තාවකාලිකව නතර කර ඇති බැවින්, 57-4195 අංක දරන වෑන් රථය අලුත් වැඩියා කිරීම සඳහා කටයුතු යොදා ඇත.

(ඉ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමත සේවක කාර්ය මණ්ඩලය 219 කි. 2021.12.31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 178 කි. කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 07 දෙනකු හා දෛනික පදනම මත 01 අයෙකු සේවය කරනු ලබන අතර, පුරප්පාඩුව පවතින තනතුරු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇත. රජය විසින් සියලුම බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් අදාල පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත.

(ඊ) 2018 ජනවාරි සිට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 07 ක් ජී.පී.එස්. පාලන මැදිරියේ සේවය සඳහා යොදවා ඇත. මෙම සේවකයින්ගේ සේවා අවශ්‍යතාවය පිළිබඳ ජාතික ගමනාගමන කොමිෂන් සභා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය යටතේ ඔවුන් ස්ථිර කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යංශයේ ලේකම් මගින් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා දිගින් දිගටම ඉල්ලීම් කර ඇත. එම සෑම අවස්ථාවකදීම එම සේවකයින්ගේ සේවකාලය දීර්ඝ කිරීමට පමණක් අනුමැතිය ලබා දී ඇත. 2022.12.31 දින දක්වා සේවා කාලය දීර්ඝ කර ඇති මෙම සේවකයින්, ස්ථිර කිරීමට හෝ වසරකින් සේවා කාලය දීර්ඝ කිරීමට ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් ගේ නිර්දේශයෙන්, කළමණාකරන සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉල්ලීම් කර ඇත.

(උ) රටේ පැවති COVID වසංගත තත්වය හේතුවෙන් නිශ්චිත ඉලක්ක අනුව කටයුතු කිරීමට නොහැකි වීම මත මෙම විචලනයන් සිදුවූ අතර ඉදිරි වර්ෂයේදී විචලනයන් අවම කිරීම පිළිබඳව අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ඌ)

❖ 2021 වර්ෂයේ අපේක්ෂිත (ඇස්තමේන්තු කළ ) ආදායම නොලැබී යාම නිසා ආයතනය පවත්වාගෙන යාමේ වියදම් දරමින් ව්‍යාපෘති සඳහා යෙදවීමට අරමුදල් හිගයක් ඇති විය. ඒ අනුව පහත ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන් කළද එම ව්‍යාපෘතිවල ඉලක්ක කළ සියළු කාර්යයන් ඉටු කිරීමට එම වෙන් කළ මුදල් නොලැබීම නිසා එම ව්‍යාපෘතිවල මුදල් ඌණ උපයෝජනයක් වූ බව පෙන්නුම් කර ඇත.

- බස් පර්යන්තයන් මෙහෙයුම් කිරීම සහ නඩත්තු කිරීම
- බස්රථවල සේවක කණ්ඩායම් පුහුණු හා පොදු ප්‍රවාහන (PT) පුහුණු වැඩසටහන්
- අභ්‍යන්තර තොරතුරු සහ තාක්ෂණ පද්ධති
- GPS උපකරණ හා පාලන මැදිරි නඩත්තු කිරීම
- ප්‍රවාහන සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්

❖ එවකට මුදල් ඇමතිතුමා විසින් " රාජ්‍ය වියදම් සමාලෝචනය " යන මැයෙන් ඉදිරිපත් කරන ලද 2021.08.28 දිනැති සහ අංක 21/1596/304/134 වූ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබී ඇති අනුමැතිය පරිදි " නියමිත අනුමැතීන් යටතේ ප්‍රතිපාදන වෙන්වී තිබුනද දැනට ආරම්භ කර නොමැති වැඩසටහන් , මිළදී ගැනීම් , ඉදිකිරීම්, ගොඩනැගිලි නවීකරණය හා වැඩිදියුණු කිරීම් ආදිය තාවකාලිකව අත්හිටුවීම " අනුව කටයුතු කරමින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් ඒ වන විට ආරම්භ කර නොතිබූ පහත ව්‍යාපෘති ආරම්භ නොකිරීම.

- **ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ගොඩනැගිලි නවීකරණය සහ බස් පර්යන්ත නඩත්තු කිරීම**
- **විදුලිබල පරිභෝජනය අඩු කිරීමට විකල්ප ක්‍රම හඳුන්වාදීම -**

N Solar Consultants (Pvt) Ltd මගින් ශක්‍යතා අධ්‍යන වාර්තාව සකසා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර අනුමැතිය ලබාගැනීම සහ සූර්යය පැනල සවිකිරීමට වහලය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් සකස්

කර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර අනුමැතිය ලබාගැනීම පමණක් මේ වන විට සිදුකරන ලදි.

- නාගරික ප්‍රවාහනය වැඩසටහන්
- බැස්ටියන් මාවත හා වවුනියා බස් පර්යන්ත නවීකරණය
- කිළිනොච්චි බස් නැවතුම්පල - උතුරු පළාත් සභාවේ ඉල්ලීම අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඉතිරි ඉදිකිරීමේ කටයුතු උතුරු පළාත් සභාවට පවරන ලදි.

❖ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදල් හිගය හේතුවෙන් විකල්ප ක්‍රමවේද අනුගමනය කරමින් පහත ව්‍යාපෘති සඳහා වැය වන මුදල් සීමා කිරීම සහ මුදල් වැය නොවන කාර්යයන් පමණක් ඉටු කිරීමට කටයුතු කිරීම.

- **වාර්ෂික ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛණ සකස් කිරීම -**

ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛණ වාර්තාව 2021 වර්ෂයට පෙර වර්ෂවලදී මුද්‍රිත පිටපත් (පොත්) වශයෙන් සකස් කර වාර්ෂිකව ප්‍රසිද්ධ කරන ලදි. නමුත් 2021 වර්ෂයේ අරමුදල් හිගයක් පැවති හෙයින් එම වාර්තාව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන මෘදු පිටපත් වශයෙන් පමණක් සකස් කර ප්‍රසිද්ධියට පත්කිරීම මගින් ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛණ සකස් කිරීම සහ ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා වැය වන මුදල අඩුකර ගැනීම.

- **බස් ගාස්තු සකස් කිරීමේ ව්‍යාපෘතිය -**

ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය අනුව බස් ගාස්තු සංශෝධනය ප්‍රධාන පුවත්පත් තුනක සිංහල , දෙමළ , ඉංග්‍රීසි භාෂා වලින් පලකළ යුතුවේ. ඒ අනුව දිනමිණ , තිනකරන්, ඩේලි නිවුස් පුවත්පත්වල පිටු දෙකක් ආවරණය වන පරිදි දැන්වීම් පලකරනු ලැබේ. මේ සඳහා වසරකට රුපියල් මිලයනයක් පමණ වැය වේ. නමුත් මෙවර බස් ගාස්තු සංශෝධනය සම්බන්ධ තොරතුරු විද්‍යුත් ක්‍රම භාවිතයෙන් (ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය, මුහුණු පොත සහ ප්‍රවාහන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ) ජාති ක ගමනාගමන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක බස් පර්යන්තවල , මාකුඹුර බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථානයේ ඩිජිටල් පුවරුවල , මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි වෙත ලිඛිතව යොමු කර එම ස්ථානවලින් එම තොරතුරු ලබාගත හැකි බව මහජනයාට දැනුම් දීම සඳහා පමණක් කුඩා දැන්වීමක් සිංහල , දෙමළ , ඉංග්‍රීසි භාෂා වලින් උක්ත සඳහන් පුවත්පත්වල පලකරන ලදි. එමගින් මෙම ව්‍යාපෘති සඳහා දැරීමට සිදුවන වියදම් අඩුකිරීම.

- **මාර්ග තදබදය මගහැරීම සහ ඉහළ සේවාවක් සැපයීමේ පර්යේෂණ -**

කොවිඩ් - 19 වෛරස් වසංගත තත්ත්වය ව්‍යාප්ත වීමත් සමග සංචරණ සීමා පැනවීම හේතුකොටගෙන මගීන්ගේ ගමනාගමන කටයුතු විශාල වශයෙන් වෙනස්වීම සිදුවිය. එහෙයින් මෙම වසර තුළ සිදු කරනු ලබන සමීක්ෂණ වලින් සත්‍ය තත්ත්වය විද්‍යාමාන නොවන හෙයින්

2021 වසරේ සැලසුම් කළ සමීක්ෂණ සිදු නොකරන ලදි. නමුත් කොවිඩ් - 19 වෛරස් වසංගත තත්ත්වය හේතුකොට ගෙන නිවසේ සිට රාජකාරී සිදුකිරීම, මාර්ග ගත ක්‍රමයෙන් රාජකාරී , අධ්‍යාපන කටයුතු, ව්‍යාපාරික කටයුතු සිදුකිරීම වැනි තත්ත්වයන් පොදු ප්‍රවාහන බස්රථ සේවාව සඳහා සිදුකළ බලපෑම හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කරන ලදි. එම සමීක්ෂණයේ තොරතුරු රැස්කිරීම, නිවසේ සිට රාජකාරී සිදුකරන (ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවයේ නියුතු දුර බැහැර පදිංචි වී සිටින නිළධාරීන් ) මගින් ඔවුන් පදිංචි දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි සහ එසේ නිලධාරීන් පදිංචි නොමැති දිස්ත්‍රික්කවල පළාත් ප්‍රවාහන අධිකාරිවල නිළධාරීන් මගින් සිදුකිරීම සහ ගූගල් ෆෝරමයක් මගින් දත්ත රැස් කිරීම සිදු කිරීමෙන් සමීක්ෂණ සඳහා වැය වන මුදල් අඩුකර ගැනීම.

- **දුර දැක්වෙන නාමපුවරු සවිකිරීම -**

දුර ගමන් සේවා බස්රථ නැවතුම් සංඥා පුවරු ව්‍යාපෘතිය යටතේ කොළඹ සිට බෙන්තර පාලම දක්වා ( බස්නාහිර පළාත් සීමාව තුළ ) සංඥා පුවරු 42 ක් මිළදී ගැනීමට බස්නාහිර පළාත් ප්‍රවාහන අධිකාරිය කැමැත්ත ප්‍රකාශ කළ බැවින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමත පිළිවිතර හා අධීක්ෂණය යටතේ එම සංඥා පුවරු සකස් කරවා ගැනීම සඳහා බස්නාහිර පළාත් ප්‍රවාහන අධිකාරිය වෙත යොමු කරන ලදි. එමගින් දුර ගමන් සේවා සංඥා පුවරු ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් දැරීමට වූ වියදම් අඩුකර ගැනීම.

- **ඒකාබද්ධ කාලසටහන් -**

2021 වර්ෂයේ මැයි මස සිට නොවැම්බර් මස 01 දින දක්වා පළාත් සංචරණ සීමා හේතු කොට ගෙන අන්තර් පළාත් බස්රථ ධාවනය සිදු නොවූ හෙයින් මෙම ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේ සිදුකිරීමට ඉලක්ක කරන ලද කාර්යයන් තාවකාලිකව අත්හිටුවීමට සිදු විය. අධිවේගී මාර්ගවල කාලසටහන් මගී අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීම හා අභියාචනා අධිකරණ සමථයකට අනුව බදුල්ල - කොළඹ හා සමගාමී සේවා සඳහා ඒකාබද්ධ කාලසටහන ක්‍රියාත්මක කිරීම නොවැම්බර් මස එක දිනෙන් පසු සිදු කරන ලදි. ඒ අනුව නව කාලසටහන් සකස් කිරීම සඳහා අදාළ පාර්ශව සමග සාකච්ඡා පැවත්වීම, මගී ඉල්ලුම හඳුනාගැනීම , දත්ත විශ්ලේශනය වැනි කටයුතු සිදු නොවූ හෙයින් එම ව්‍යාපෘතිය සඳහා මුදල් වැය කිරීමට සිදු නොවීම.

- **ප්‍රවාහනය සම්බන්ධ නීති සකස් කිරීම -**

ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ කළ යුතු සංශෝධන ඇතුළත් කර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2020/11/20 දින අමාත්‍ය මණ්ලයට ඉදිරිපත් කළ අතර , එයට 2020/12/22 වන දින අනුමැතිය ලබාදී ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. මේ වන විටත් මෙම සංශෝධිත පනත නීති කෙටුම්පත් සම්පාදක

දෙපාර්තමේන්තුවේ පවතින අතර , මෙහි නිගමන කොන්දේසි සකස් කළ හැක්කේ පනත් සංශෝධනය අනුමත වූවායින් පසුව බැවින් 2021 වර්ෂයේදී ඒ සඳහා වියදම් දැරීමක් සිදු නොවීම.

- **පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය -**

  පෙර ගෙවුම් කාඩ්පත් ව්‍යාපෘතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාව , ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, මහජන බැංකුව,මහ බැංකුවේ නියෝජිතායතනය වශයෙන් ලංකා ක්ලියර් ආයතනය හා සියලු ආයතන ඇතුලත්ව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි.

  එම සියලු ආයතන මෙම ව්‍යාපෘතියට දක්වන දායකත්වය මත මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම තීරණය වේ. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතියට සම්බන්ධ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබාගැනීම , ගිවිසුම් අත්සන් කිරීම් වැනි මුදල් වියදම් නොවන කාර්යයන් 2021 වර්ෂයේදී අවසන් කර ඇති බැවින් මෙම ව්‍යාපෘතිය සඳහා වැයවූ මුදල් අවම වීම.

ඒ අනුව 2021 වර්ෂයේ පැවති වසංගත තත්ත්වය හේතුකොට ගෙන ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අපේක්ෂිත ආදායම අඩුවීම, පළාත් සංචරණ සීමා පැනවීම නිසා අන්තර් පළාත් බස්රථ සේවා මාස ගණනක් තිස්සේ ධාවනය නොවීම, සේවකයින් සේවයට අඛණ්ඩව වාර්තා කිරීමට නොහැකිවීම වැනි අර්බුදකාරී වාතාවරණය තුළ වුවද ඉහත දක්වා ඇති ආකාරයේ විවිධ ක්‍රමෝපායන් මාර්ගයෙන් භෞතික ප්‍රගතිය ළඟා කර ගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව මූල්‍ය උපයෝජනය අඩුවීම නොව අපේක්ෂිත ආදායම නොලැබී යාම හේතුකොට ගෙන ඒ ඒ ව්‍යාපෘති සඳහා යෙදවීමට අරමුදල් නොමැති වීම මත අදාළ ව්‍යාපෘතිවල මුදල් වියදම් නොවන භෞතික කාර්යයන් ඉටුකිරීම සහ මුදල් අඩුවෙන් වැය වන ක්‍රමෝපායන් යටතේ භෞතික ප්‍රගතිය කරා ළඟාවීමට උත්සහ දැරීමක් බව කාරුණිකව සඳහන් කරමි.

(එ) පෙරගෙවුම් කාඩ්පත් ව්‍යාපෘතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාව තනිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක් නොවන අතර, එයට ප්‍රවාහන අමාත්‍යාංශය ප්‍රමුඛ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, මහජන බැංකුව, මහබැංකුවේ නියෝජිතායතනය වශයෙන් ලංකා ක්ලියර් ආයතනය හා සියලු ආයතන ඇතුලත්ව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. එම සියලු ආයතන මෙම ව්‍යාපෘතියට දක්වන දායකත්වය මත මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාම තීරණය වේ. මූල්‍යමය ප්‍රගතිය අඩු මට්ටමක පැවතියද, මෙහි නියමු ව්‍යාපෘතිය 2022 මාර්තු 28 වන දින ගාල්ල-මාකුඹුර ධාවනය වන පුද්ගලික බස්රථවල ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබිණි.

එසේම ජාතික කොමිෂන් සභාවේ කාර්යාල පරිශ්‍රයේ විදුලි බල අවශ්‍යතාවය සඳහා සූර්යබල ශක්තිය උපයෝගීකර සූර්යකෝෂ සවිකර විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා

- N Solar Consultants (Pvt) Ltd මගින් ශක්‍යතා අධ්‍යන වාර්තාව සකසා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර අනුමැතිය ලබාගැනීම සහ
- සූර්යය පැනල සවිකිරීමට වහලය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් සකස්කර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර අනුමැතිය ලබාගැනීම 2021 වර්ෂයේදී සිදු කරන ලදී.

නමුත් දැනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අදායම් කෙරෙහිද සැලකිලිමත්ව මෙම කාලවකවානුව තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි බැවින් ආයතනය ආර්ථිකමය වශයෙන් ස්ථාවරත්වයට පත්වූ

පසු සූර්යය කෝෂ සවිකිරීමට අදාළ වහලය ඉදිකිරීමට සහ ව්‍යාපෘතියට අදාළ අනෙකුත් කටයුතු සිදු කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී.(පත්‍රිකා අංක 77/2021) - ඇමුණුම 01

තවද ඉහත 2.4 (අ) පිළිතුරෙහි සඳහන් කරන ලද , එවකට මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබී ඇති අනුමැතිය පරිදි මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු නොකරන ලදී.